# ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

# වාර්ෂික වාර්තාව

# 2013

NGJA/6/Annual Report/2013 25.02.2014

ගරු පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යතුමා
පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශය
82,"සම්පත් පාය"
රජමල්වත්ත පාර
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි තුමනි,

2013 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව

1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනතේ 32 (3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) වගන්තිය අනුව පහත සඳහන් ලේඛන ඔබතුමා වෙත ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

1. 2013 වර්ෂය සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පාලන වාර්තාව.
2. විගණකාධිපති විසින් නිසි ලෙස විගණනය කරන ලද 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ ලාභා ලාභ ගිණුම හා 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය
3. විගණකාධිපති වාර්තාව

ස්තුතියි
ඔබේ හිතවත්

**අමිත ගමගේ**
සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

## දැක්ම

ශ්‍රී ලංකාව නිල් මැණික් සඳහා ලොව පුරෝගාමියා මෙන්ම අනෙකුත් කුරුවින්ද මැණික් හා ඉහල ප්‍රමිතීයෙන් යුත් ආභරණවලට කලාපීය මධ්‍යස්ථානය බවට පත්කිරීම.

## මෙහෙවර

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රවර්ධනය හා සංවර්ධනය උදෙසා පවත්නා සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින්, ප්‍රශස්ත මට්ටමින් පහසුකම් ලබා දෙමින් නවීන තාක්ෂණය උපයෝගී කොටගෙන විශ්වාසයි තත්ත්ව සහතිකරණ පද්ධතියක් තුල තිරසාර සංවර්ධනයක් ළඟාකර ගනිමින් අපගේ පාර්ශවකරුවන් වෙත ප්‍රතිලාභ සාධාරණව බෙදාහැරීම.

# මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය - 2013 වර්ෂය

| | | | පත්වූ දිනය | විශ්‍රාමගත් දිනය |
|---|---|---|---|---|
| 1 | ප්‍රසාද් ගල්හේන මහතා | සභාපති | 05.01.2012 | 17.04.2013 |
| 2 | අමිත ගමගේ මහතා | සභාපති | 17.04.2013 | |
| 3 | සරත් සමරකෝන් මහතා | සාමාජික | 14.05.2010 | 17.04.2013 |
| 4 | ආර්.එම්.ජයතිලක මහතා | සාමාජික | 14.05.2010 | 17.04.2013 |
| 5 | ජානක රත්නායක මහතා | සාමාජික | 30.06.2010 | 17.04.2013 |
| 6 | මොහොමඩ් ෆයිසාල් රෂීන් මහතා | සාමාජික | 30.06.2010 | 17.04.2013 |
| 7 | ටී.කේ.එන්.සී. තියඹරාවත්ත මහතා | සාමාජික | 17.04.2013 | |
| 8 | පි.එච්.ඕ. චන්ද්‍රවංශ මහතා | සාමාජික | 30.04.2013 | |
| 9 | ඒ.කේ. සෙනෙවිරත්න මහතා | සාමාජික | 30.04.2013 | |
| 10 | චන්ද්‍රා ඒකනායක මෙනෙවිය | සාමාජික | 30.04.2013 | |
| 11 | බන්දුල එගොඩගේ මහතා | සාමාජික | 26.06.2013 | |
| 12 | ආචාර්යය ඩබ්.එල්.ඩී.ආර්. ඒ. කුමාරතිලක මහතා | සාමාජික | 30.04.2013 | |
| 13 | ටී. එම්. සිරිසෝම මහතා | සාමාජික | 17.04.2013 | |
| 14 | අරුණ ලේකම්ගේ මහතා | සාමාජික | 17.04.2013 | |
| 15 | ආර්.ඩී.එස්. මුණසිංහ මහතා | සාමාජික | 06.05.2013 | |
| 16 | එස්.එම්.එන්. ලලිත් සේනානායක මහතා | සාමාජික | 06.05.2013 | |
| 17 | ආර්මිල් සමුන් මහතා | සාමාජික | 17.04.2013 | |

# 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ 2013 වසර සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පාලන වාර්තාව

**01.** 2013 වසර ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 19 වන වසර සනිටුහන් කරයි. සමාලෝචිත වර්ෂය තුල එහි කාර්ය භාරය මෙහෙයවන ලද්දේ රත්නපුර පිහිටි ප්‍රධාන කාර්යාලය, කොළඹ කාර්යාලය මෙන්ම රත්නපුරය, ඇහැලියගොඩ, මාතර, නාවුල, මොණරාගල යන නගරයන්හි පිහිටුවා ඇති ප්‍රාදේශීය ඒකක ද කටුනායක මැණික් අපනයන මධ්‍යස්ථානය සහ ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති මැණික් හා ස්වර්ණාභරණ හුවමාරු මධ්‍යස්ථානය මගිනි.

**02.** අධිකාරියේ කර්තව්‍යයන්

(අ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධකය කිරීම

(ආ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා යෝජනා ක්‍රම ආරම්භ කර ක්‍රියාත්මක කිරීම

(ඇ) ශ්‍රී ලංකාව ඇතුලත හෝ ඉන් පිටත හෝ මැණික් හා ස්වර්ණාභරණ සඳහා වූ වෙළඳපොළ පුළුල් කිරීම සහ මැණික් හා ස්වර්ණාභරණ සඳහා ලෝක වෙළඳපොලේ ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම

(ඈ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය දියුණු කිරීමේ අදහසින් එම කර්මාන්තවලට අදාල සෑම අංශයකම සේවක පිරිස් වලට කාර්මික පුහුණුව, විශේෂයෙන් තාපයෝජනය සහ මැණික් කැපීම පිළිබඳව පුහුණුව ප්‍රවර්ධනය කිරීම සහ ඊට අනුග්‍රහය දැක්වීම

(ඉ) අනාගත ගැණුම් කරුවන් තුල මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය කෙරෙහි විශ්වාසය ඇති කිරීමට අවශ්‍ය වියහැකි පියවරයන් ගැනීම

(ඊ) නීති විරෝධි මැණික් ගැරීම සහ නීති විරෝධි ලෙස මැණික් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම වැලැක්වීම

(උ) පතල් කැණීමේ හෝ මැණික් ගැරීමේ අයිතිවාසිකම් යම් ආරක්ෂා කිරීමක් හේතුවෙන් හෝ අන්‍යාකාරයකින් රජය වෙත රැඳී ඇති අවස්ථාවල රජයේ ඉඩම්වල හෝ ඒ මත හෝ රජය විසින් හෝ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් බැහැර කරන ලද ඉඩම්වල හෝ ඒ මත මැණික් සඳහා පතල් කැණීමේ අයිතිවාසිකම් අන්සතු කරදීම පිළිබඳව වගකිවයුතු එකම බලධරයා වශයෙන් ක්‍රියා කිරීම

(ඌ) මැණික් හා ස්වර්ණාභරණ අලෙවි කිරීමට අවශ්‍ය කාර්මික සහ වෙනත් උපදෙස් සහ යටිතල පහසුකම් සැපයීම

(එ) යම් උපලේඛන ගත ලිඛිත නීතියක්

- i එය මැණික් හෝ මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් අදාල වනතාක් දුරට,
- ii මේ පනත යටතේ අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යය අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනතාක් දුරට එම නීතියේ කාර්ය පරිපාලනය කිරීම

(ඒ) මැණික් සහ වටිනා ලෝහ වර්ග සහතික කිරීම සඳහා කාර්යාල පිහිටුවීම

(ඔ) නිෂ්පාදිතයකුගේ ඉල්ලීම පිට, සපයනු ලබන ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ස්වර්ණාභරණ නියමිත ආකාරයකට විශේෂ ලකුණකින් මුද්‍රා තබන බවට වගබලා ගැනීම

(ඕ) ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා මැණික් කර්මාන්තය, ස්වර්ණාභරණ කර්මාන්තය සහ රජයේ දෙපාර්තමේන්තු අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනැගුම හා එම සම්බන්ධීකරණයක් ගොඩනැගීම හා එම සම්බන්ධීකරණ ක්‍රියාදාමයන් තවදුරටත් වර්ධනය කිරීමේ අතරමැදියා වශයෙන් කටයුතු කිරීම

(ක) මැණික් කර්මාන්තයේ සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ සේවා නියුක්තයන්ගේ සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි සහ විශේෂයෙන් එම තැනැත්තන්ගේ ජීවිත සහ ශරීරාංග අනතුරු වලින් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවරයන් ගැනීම සහ ඒවා විධිමත් කිරීම සහ පාලනය කිරීම

**03.** **මූල්‍යය**

3.1 **ද්‍රවශීලතාවය :**

වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ රුපියල් මිලියන 48.377 ක්වූ අතර වසර අවසානයේදී එය රුපියල් මිලියන 97.961ක් විය. කල්පිරීමේ ආයෝජන (භාණ්ඩාගාර බිල්පත්) වල වසර ආරම්භයේදි රුපියල් මිලියන 191.610ක් වූ අතර එය වසර අවසානයේදී රුපියල් මිලියන 216.381ක් විය.

වර්ෂය ආරම්භයේදී අනිකුත් මූල්‍ය වත්කම් වටිනාකම රුපියල් මිලියන 544.706ක් වූ අතර වසර අවසානයේදී එය රුපියල් මිලියන 639.376ක් විය.

3.2 **ලාභදායකත්වය :**

| | 2008<br>රුපි.මිලි. | 2009<br>රුපි.මිලි. | 2010<br>රුපි.මිලි. | 2011<br>රුපි.මිලි. | 2012<br>රුපි.මිලි. | 2013<br>රුපි.මිලි. |
|---|---|---|---|---|---|---|
| මුළු අදායම | 258.180 | 219.443 | 228.962 | 250.300 | 612.004 | 507.542 |
| මුළු වියදම | 228.772 | 230.942 | 261.929 | 222.488 | 261.076 | 387.458 |
| ලාභය(බදුවලටපෙර) | **29.408** | **(11.498)** | **(32.967)** | **27.812** | **350.928** | **120.084** |

**04.** **මානව සම්පත්**:

2013 වසර අවසානයේදී අධිකාරියෙහි කාර්ය මණ්ඩලය වෘත්තිකයන්ද ඇතුළුව 245 දක්වා ලගාවිය. අප කන්ඩායමේ සාමාජිකයන්ගේ අඛන්ඩ වෘත්තීයමය සංවර්ධනය ඉහල ප්‍රමුඛස්ථානයේලා සලකනු ලබන අතර. මානව සම්පත් සංවර්ධනය කිරීමට අවස්ථා සලසාදීම අරභයා පියවර කිහිපයක් ගනු ලැබුණි.

**05.** **බලපත්‍ර නිකුත් කිරීම :**

මැණික් කර්මාන්තය සඳහා අධිකාරියෙහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් සහ ප්‍රාදේශීය කාර්යාල මගින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පසුගිය වසර පහක සංඛ්‍යා සමග සසඳා පහත දැක්වේ.

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|
| මැණික් ගැරීමේ බලපත්‍ර | 4,204 | 3,970 | 4,061 | 4,687 | 5,956 | 6,565 |
| මැණික් වෙළද බලපත්‍ර | 4,794 | 4,036 | 4,195 | 4,422 | 4,382 | 4,429 |
| මැණික් කැපීමේ බලපත්‍ර | 194 | 174 | 168 | 179 | 177 | 192 |
| මැණික් වෙන්දේසි බලපත්‍ර | 300 | 217 | 262 | 277 | 364 | 624 |
| **බලපත්‍ර එකතුව** | **9,527** | **8,357** | **8,686** | **9,565** | **10,879** | **11,810** |

**06.** **අනවසර මැණික් ගැරීම් පාලනය සහ පාරිසරික හාණි මැඩ පැවැත්වීම** :

අනවසර මැණික් ගැරීම් සහ ඒතුලින් සිදුවන පාරිසරික විනාශයන් මැඩ පැවැත්වීම සඳහා සමාලෝචිත වර්ෂය තුල දී අධිකාරියෙහි නිලධාරීන් වැටලීම් ගණනාවක් සිදු කරන ලදී. දඩ ගැසීම් තුලින් රුපියල් මිලියන 11.862ක් උපයා ගන්නා ලදී. අත්හැර දමා තිබූ මැණික් පතල් වසා දැමීමට හා හාණියටපත් ගංගා ඉවුරු පුනරුත්ථාපනය කිරීමට අධිකාරිය විසින් පියවර ගන්නා ලදී.

**07. සේවා සහ අනිකුත් සංවර්ධන කාර්යයන්:**

7.1 **අපනයන හා අපනයන සංවර්ධනය.**

1. පහත සඳහන් තෝරාගත් ජ්‍යාතන්තර වෙළඳපොලවල් සහ ප්‍රදර්ශන යන්හීදී "ශ්‍රී ලංකා පැවිලියන් " සඳහා අනුග්‍රහය දැක්වීම සහ සංවිධානය කිරීම
   - i. ෂැංහයි ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - 2013 මැයි 10-13
   - ii. ලාස් වේගාස් JCK ප්‍රදර්ශනය - 2013 මැයි 31 සිට ජුනි 03
   - iii. සිංගප්පූරුවේ ජාත්‍යාන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - 2013 ජූලි 4 සිට 7
   - iv. චීන ජාත්‍යාන්තර ස්වර්ණාභරණ සහ මැණික් වෙළඳ පොළ - 2013 ඔක්තෝබර් 31 සිට නොවැම්බර් 04
   - v. චීන ජාත්‍යාන්තර රත්තරන්, ස්වර්ණාභරණ හා මැණික් වෙළඳ පොළ - 2013 නොවැම්බර් 8 සිට 11
2. මැණික් හා ස්වර්ණාභරණ අංශයේ සහභාගීත්වයෙන් පහත සඳහන් අවස්ථාවන් සංවිධානය කිරීම
   - i. ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සංවිධානය කරන ලද මුම්බායි සහ බැංගලෝර් හී ශ්‍රී ලාංකික තුන්දින (03) මහා ප්‍රදර්ශනය
   - ii. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සංවිධානය කරන ලද දකුණු ආසියානු මහා වෙළඳ පොළ
   - iii. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සංවිධානය කරන ලද 82 වන ඉස්මීර් ජාත්‍යයන්තර වෙළඳ පොළ
3. දේශීය වෙළඳ පොලවල් සහ ප්‍රදර්ශන සඳහා "ජා.මැ.ස්.අ.පැවිලියන්" මගින් සංවිධානය හා අනුග්‍රහය දැක්වීම
   - i ජාතික වාණිජ මණ්ඩලය මගින් මෙහෙයවන ලද " 2013 ආයුර්වේද ප්‍රදර්ශනය"
   - ii 23 වන ජාත්‍යාන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - ෆැසට් (FACET) ශ්‍රී ලංකා 2013 සඳහා අනුග්‍රහය දැක්වීම සහ සංවිධානය කිරීම.
   - iii. ශ්‍රී ලංකා මැණික් විද්‍යාඥයින්ගේ සංගමය මෙහෙයවන ලද "ජුවෙල්ස් 2013"
4. බැංකු සහ පෞද්ගලික ආයතන වලට රත්තරන් ආනයනයේදී පහසුකම් සැලසීම හා මෙහෙයවීම
5. මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රජාවට ඔවුන්ගේ යන්ත්‍ර උපකරණ සහ අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී අවශ්‍ය විදේශ ව්‍යවහාර මුදල් ( ඇමරිකන් ඩොලර් 50,000 ට අඩු ) නිර්දේශ ලිපි නිකුත් කිරීම කිරීම සහ මෙහෙයවීම.
6. මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන විදේශීය ව්‍යාපාරික ආයතන සහ පුද්ගලයින්ගේ ඉල්ලීම මත ඔවුනට ශ්‍රී ලංකාවේ රැඳී සිටීමට අවශ්‍ය වීසා ලබාගැනීමට සහ වීසා අලුත් කරවා ගැනීමට නිර්දේශිත ලිපි අදාල අමාත්‍යාංශය වෙත නිකුත් කිරීම.
7. ශ්‍රී ලාංකික මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ නියුතු වූවන්හට වීසා ලබා ගැනීමේ ක්‍රියාවලියේදී අදාල රටවල් වල විසා නිලධාරීන් වෙත විසා ලිපි නිකුත් කිරීම.
8. www.srilankagemautho,com නමින් අන්තර් ජාල වෙබ් අඩවියක් පවත්වාගෙන යාම.
9. ශ්‍රී ලංකාව තුල රාජ්‍ය අනුග්‍රහය මත පවත්වාගෙන යනු ලබන මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳ සංකීර්ණ "ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ භුවමාරුව" මගින් පහසුකම් සැපයීම සහ ප්‍රවර්ධනය කිරීම.
10. කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩා හා මධ්‍යම පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදකයන් පදනම් කරගෙන ස්වර්ණාභරණ නිෂ්පාදන ආයුධ සහ උපකරන නිකුත් කිරීම.
11. ස්වර්ණාභරණ කර්මාන්තයේ නව ප්‍රවණතා සහ සම්මතයන් පිළිබඳව කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් මෙහෙයවීම සහ සංවිධානය කිරීම.

12. දිවයින පුරා විසිරී සිටින කුඩා සහ මධ්‍යම පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදකයන් හට තමන්ගේ ස්වර්ණාභරණ අයිතමයන් විකිණිමට සහ ප්‍රවර්ධනයට " රත්නදීප" වෙලඳ කුටි සහ ප්‍රදර්ශනාගාර කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම.

13. මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේදී භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය, ආයුධ, යන්ත්‍ර සහ උපකරණආනයනය කිරීමේ දී සහන බදු අනුපාතයන් යටතේ ආනයනයට සහාය වීම.

14. රාජ්‍ය සහ පුද්ගලික අංශයේ මැණික් සහ ස්වර්ණාභරණ සම්බන්ධ නියෝජිත මණ්ඩලයන් හට ඔවුන්ගේ රාජකාරි හෝ පුද්ගලික ව්‍යාපාරික ගමන් වලදී පහසුකම් සැපයීම.

15. කටුනායක ගුවන් බඩු ගම්මානයේ මැණික් අපනයන මධ්‍යස්ථානයේ" කටයුතු සඳහා අගහරුවාදා සහ සිකුරාදා දිනයන්හී පැය 24 පුරාම පහසුකම් සැපයිම.

16. කිම්බර්ලි ක්‍රියාවලී සහතික ක්‍රමය යටතේ රළු දියමන්ති අපනයනයට සහ ආනයනයට පහසුකම් සැපයීම හා අධීක්ෂණය කිරිම.

**08. මැණික් හා ස්වර්ණාභරණ අපනයනය :**

පසුගිය වසර පහක සහ සමාලෝචිත 2013 වසර තුල ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ අපනයනය පිළිබඳ තත්ත්වය පහත දැක්වෙන සංඛ්‍යා මගින් නිරූපනය වේ**:**

| | **2008**<br>රු. මිලි. | **2009**<br>රු. මිලි. | **2010**<br>රු. මිලි. | **2011**<br>රු. මිලි. | **2012**<br>රු. මිලි. | **2013**<br>රු. මිලි. |
|---|---|---|---|---|---|---|
| මැණික් අපනයන | 8,281.055 | 7,225.8 | 7,488.6 | 10,027.6 | 14,557 | 14,805 |
| මැණික් - NSS විශේෂ ව්‍යාපෘතිය | - | - | - | - | - | 1,839 |
| ස්වර්ණාභරණ අපනයන | 1,727.926 | 1,522.9 | 1,490.5 | 1,732.3 | 2,444 | 2,194 |
| ගෙවුඩ අපනයනය | 163.634 | 107.7 | 136.5 | 146.7 | 225 | 122 |
| දියමන්ති ප්‍රතිඅපනයනය | 44,393.700 | 35,965.96 | 36,030.1 | 45,381.1 | 52,893 | 37,855 |
| දියමන්ති ආභරණ අපනයනය | 932.390 | 417.5 | 312.5 | 375.8 | 324 | 229 |
| මුළු අපනයනය | **55,498.705** | **45,239.86** | **45,458.20** | **57,663.5** | **70,443** | **57,074** |

අමිත ගමගේ

සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය** ***2014-02-27***

# ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

## දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය

| | සටහන් | 2013 | 2012 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | **3** | 227,741,261 | 245,815,430 |
| කල්බදු ඉඩම් (භාවිතයට අයිති) | **4** | 30,727 | 33,091 |
| අස්පෘශ්‍ය වත්කම් | **5** | 357,792 | 566,667 |
| විලම්භිත බදු වත්කම් | **6** | (18,292,344) | (16,062,221) |
| අනිකුත් වත්කම් | **7** | 371,939,331 | 371,939,331 |
| විකිණිය හැකි මූල්‍ය වත්කම් | **8** | 1,200,000 | 1,200,000 |
| **ජංගම නොවන වත්කම් එකතුව** | | **582,976,766** | **603,492,298** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | **9** | 2,160,405 | 1,699,601 |
| ලැබිය යුතු දෑ | **10** | 9,396,134 | 12,310,785 |
| කල්පිරෙන තෙක් රඳවා ගත් ආයෝජන (HTM) | **11** | 216,381,558 | 191,609,933 |
| තැන්පත් සහ අත්තිකාරම් | **12** | 32,709,520 | 31,690,952 |
| ඉදිරියට ගෙවුම් | | - | 499,457 |
| සේවක ණය සහ අත්තිකාරම් | **13** | 13,659,749 | 13,749,877 |
| අනිකුත් මූල්‍ය වත්කම් | **14** | 639,376,488 | 544,706,305 |
| මුදල් සහ මුදල් සමානයන් | **15** | 97,964,396 | 48,377,798 |
| **ජංගම වත්කම් එකතුව** | | 1,011,648,249 | **844,644,708** |
| **මුළු වත්කම්** | | **1,594,625,015** | **1,448,137,006** |
| **ස්කන්ධ සහ බැරකම්** | | | |
| **ස්කන්ධ** | | | |
| දායක ප්‍රාග්ධනය | **16** | 30,000,000 | 30,000,000 |
| මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල | **17** | 26,927,498 | 27,227,498 |
| ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල | **18** | 29,059,263 | 23,657,481 |
| මැණික් ත්‍යාග අරමුදල | **19** | 36,511,450 | 33,302,890 |
| මැණික් ප්‍රත්‍යාගණන සංචිත | **20** | 355,074,648 | 355,074,648 |
| ප්‍රත්‍යාගණන සංචිතය | **21** | 52,945,424 | 52,945,425 |
| රඳවා ගත් ඉපයුම් | | 440,155,420 | 383,673,444 |
| **ස්කන්ධඑකතුව** | | **970,673,703** | **905,881,386** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදියාව | **22** | 23,995,857 | 18,607,015 |
| විලම්භිත බදු බැදියාව | **6** | - | - |
| -කල් බදු ගෙවීමේ බැදියාව - පියවීමේ කාලසීමාව අවුරුද්ද ඉක්මවන | **23.1** | 11,680 | 13,241 |
| **ජංගම් නොවන බැරකම් එකතුව** | | **24,007,537** | **18,620,256** |
| **ජංගම බැරකම්** | | | |
| කල් බදු ගෙවීමේ බැදියාව - පියවීමේ කාලසීමාව අවුරුද්ද නොඉක්මවන | **23.1** | 2,230 | 2,495 |
| ගෙවිය යුතු දෑ | **24** | 64,715,858 | 38,172,804 |
| මැණික් ගැරීමේ තැන්පතු | | 326,673,784 | 226,048,309 |
| ආපසු ගෙවිය යුතු තැන්පත් සහ අත්තිකාරම් | **25** | 96,452,755 | 72,284,306 |
| ව්‍යවස්ථාපිත ගෙවීම් | **26** | 92,638,388 | 166,462,222 |
| වෙන්කිරීම් සහ උපචිත වියදම් | **27** | 19,460,760 | 20,665,228 |
| **ජංගම බැරකම් එකතුව** | | **599,943,775** | **523,635,364** |
| **ස්කන්ධ සහ බැරකම් එකතුව** | | **1,594,625,015** | **1,448,137,006** |

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම කළමණාකාරීත්වය සතුවේ.

............................................... ..............................

**සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි** **ප්‍රධාන ගණකාධිකාරි**

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශණය

| | සටහන් | 2013 | 2012 |
|---|---|---|---|
| අයභාරය | **28** | 370,695,500 | 530,208,556 |
| **අනිකුත් ආදායම්** | **29** | 26,730,178 | 34,191,429 |
| පරිපාලන වියදම් | **30** | (126,580,200) | (96,694,548) |
| සේවක වියදම් | **31** | (130,071,227) | (116,196,580) |
| ප්‍රවර්ධන වියදම් | **32** | (30,807,746) | (48,184,513) |
| මෙහෙයුම් ලාභය | | **109,966,504** | **303,324,343** |
| ශුද්ධ මූල්‍ය ආදායම | **33** | 110,117,497 | 47,603,957 |
| **ශුද්ධ මූල්‍ය ආදායමට පසු ලාභය** | | **220,084,001** | **350,928,300** |
| ඒකාබද්ධ අරමුදලට දායකය | | (100,000,000) | - |
| **බදුවලට පෙර ලාභය** | | **120,084,001** | **350,928,300** |
| ආදායම් බදු වියදම් | **34** | (60,921,156) | (165,810,740) |
| **වර්ෂය සඳහා ලාභය** | | **59,162,844** | **185,117,561** |
| | | | |
| වර්ෂය සඳහා ලාභය | | 59,162,844 | 185,117,561 |
| අනිකුත් විස්තීරණ අදායම් | | - | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | | **59,162,844** | **185,117,561** |

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශණය

| | 2013 | 2012 |
|---|---|---|
| **බදුවලට පෙර ලාභය** | **120,084,001** | **350,928,300** |
| **ගැලපීම්** | | |
| ක්ෂයවීම් | 25,259,064 | 13,093,088 |
| අස්පෘෂ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය | 208,875 | 376,375 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් සඳහා ප්‍රතිපාදන | 8,115,151 | (115,661) |
| ලාභාංශ | (1,351,171) | (838,432) |
| ස්ථාවර වත්කම විකිණීමේ ලාභ | (103,034) | (10,976,843) |
| පොලී ආදායම් | (110,141,997) | (47,138,919) |
| කල්බදු ගෙවීම් බැදියාව මත මූල්‍ය පිරිවැය | 24,500 | 24,190 |
| ඉඩම් භාවිතා කිරීමේ අයිතිය මත ක්‍රමක්ෂය | 2,364 | 2,364 |
| තැන්පත් සහ අත්තිකාරම් හාණි වෙනුවෙන් ප්‍රතිපාදන | - | 76,500 |
| බොල්ණය | 1,404,560 | - |
| නෛතික බැදීම් සඳහා ප්‍රතිපාදන | 3,400,000 | 195,300 |
| දේපළ, පිරියත හා උපකරණ හාණි වෙනුවෙන් ප්‍රතිපාදන | 1,952,934 | 2,934,756 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **48,855,247** | **308,561,018** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | |
| තොග | (460,804) | 646,378 |
| ලැබිය යුතු දෑ | 2,914,651 | 4,087,819 |
| තැන්පත් සහ අත්තිකාරම් | (1,018,568) | 43,168 |
| පෙර ගෙවූ වියදම් | 499,457 | 155,699 |
| සේවක ණය සහ අත්තිකාරම් | 90,128 | 952,591 |
| ගෙවිය යුතු දෑ | 26,543,054 | (3,220,158) |
| මැණික් ගැරීමේ තැන්පතු | 100,625,475 | 75,719,776 |
| ලැබූ තැන්පත් සහ අත්තිකාරම් | 24,168,449 | 16,276,554 |
| ප්‍රතිපාදන සහ උපචිත වියදම් | (1,799,657) | 18,941,525 |
| මෙහෙයුම් වලින් ජනිත මුදල් | **200,417,432** | **422,164,369** |
| විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් | (2,726,309) | (10,848,643) |
| ගෙවූ බදු | (135,980,365) | (7,123,178) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල්** | **61,710,758** | **404,192,548** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහ** | | |
| දේපළ, පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම් | (12,141,003) | (59,737,840) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් | 130,700 | 10,976,843 |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත්කර ගැනීම් | - | - |
| ලැබූ ලාභාංශ | 901,934 | 838,432 |
| අනිකුත් මූල්‍ය වත්කම් වල ශුද්ධ ආයෝජනය | (94,670,183) | (240,365,948) |
| භාණ්ඩාගාර බිල්පත් ශුද්ධ ආයෝජනය | (24,771,625) | (160,141,058) |
| ලැබූ පොලී | 110,141,997 | 47,138,919 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් (යෙදවීම්)** | **(20,408,179)** | **(401,290,651)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | |
| මැණික් ගැරීමේ සුහසාධන අරමුදලට භාවිතා කිරීම් | (300,000) | (129,000) |
| කල්බදු ගෙවීම් බැදියාවන් සමථයකට පත්කිරීම් | (26,325) | (26,325) |
| ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලට දායකය | 5,401,782 | 6,202,398 |
| මැණික් ත්‍යාග අරමුදලට දායකය | 3,208,560 | 3,803,702 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් (යෙදවීම්)** | **8,284,017** | **9,850,774** |
| **මුදල් හා මුදල් සමානයන්ගේ ශුද්ධ වෙනස්වීම** | **49,586,597** | **12,752,671** |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමානයන්** | **48,377,798** | **35,625,127** |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමානයන් (සටහන් 15)** | **97,964,396** | **48,377,798** |

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 1.1 පිළියෙල කිරීමේ පදනම

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙහි (අධිකාරිය) මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව පිළියෙල කර ඇත. මූල්‍ය වත්කම් ඒවායේ ඓතිහාසික පිරිවැය, ඒවායේ විකුණුම් මත ලබා ගත හැකි සත්‍ය වටිනාකමට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. සමහර ගැටළු සහගත ගිණුම් ඇස්තමේන්තු ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතයන්වල (SLFRSs) නියම කර ඇති කරුණු වලට එකගව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරේ. ගිණුම්කරණ ප්‍රමිත අදාල කර ගැනීමේ ක්‍රියාවලියේදී කළමණාකාරීත්වයේ අවශ්‍යතාවය මත තීරණය කර යොදාගැනේ. සංකීර්ණත්වයෙන් විවිධ වූ තීක්ෂණ ලෙස තීරණ ගැනීමේ කරුණු වලදී හෝ මූල්‍ය ප්‍රකාශන වලට වැදගත් වන කරුණු භාරගැනීම හෝ ඇස්තමේන්තු කිරීම සහ ගිණුම් වල හෙළිදරව් කිරීම සිදුකර ඇත.

### 1.2 ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්

අනිකුත් විදියකින් දක්වා නොමැති නම් පහත සඳහන් කර ඇති ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට පරිවර්තනය කිරීම ආරම්භක දිනයට පැවති මූල්‍ය තත්ත්වය ඉදිරිපත් කරන ලද කාල පරිච්ඡේද වලට අදාලව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන වල ස්ථිරව යොදාගෙන ඇත.

මෙම වර්ෂයේදී මනාලෙස ඉදිරිපත් කිරීම සහ සැසඳීමට හැකිවන පරිදී අවශ්‍ය අවස්ථා වලදී පසුගිය වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

### 1.3 විදේශීය මුදල් පරිවර්තනය කිරීම

#### 1.3.1 ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය සහ ක්‍රියාකාරීත්වය

මූල්‍ය ප්‍රකාශයන්හී අඩංගු ගණු දෙණු සහ ශේෂයන් ආයතනය ක්‍රියාත්මක වනු ලබන මූලික ආර්ථික පරිසරයේදී භාවිතා කරනු ලබන මුදල් මත ගණනය කර ඇත. අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රුපියල් මගින් ඉදිරිපත් කර ඇත.

#### 1.3.2 ගණු දෙණු සහ ශේෂයන්

විදේශීය මුදල් ගණුදෙණු එකී ගණුදෙණුව සිදුවන අවස්ථාවේ පවතින විදේශ මුදල් හුවමාරු අනුපාතයන් භාවිතා කරමින් ක්‍රියාකාරීත්වයේ පවතින මුදල් වලට පරිවර්තනය කරනු ලැබේ. එකී ගණුදෙණු පියවීමේදී ඇතිවන විදේශ මුදල් හුවමාරු ලාභය හෝ අලාභය සහ වර්ෂය අවසානයේ පරිවර්තනයන් එදිනට පවතින විදේශ මුදල් හුවමාරු වටිනාකම මත මූල්‍ය වත්කම් සහවිදේශ මුදල් මත ඇතිවන බැදීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හී හදුනාගැනේ.

ණය හිලව් කිරිමේ වියදම් වලදී ඇතිවන මුදල් පරිවර්තිත වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශන වලදී හදුනාගැනේ.

#### 1.3.3 දේපල, පිරියත හා උපකරණ

කළමනාකාරීත්වය අදහස් කරන පරිදී වත්කම් යම් ස්ථානයක පිහිටුවීමට හෝ ක්‍රියාකාරීත්වයට ගෙන ඒමට දරනු ලබන සෘජුවම ආරෝපිත කල හැකි ඕනෑම පිරිවැයක් දේපල, පිරියත හා උපකරණ වල වටිනාකමට ඇතුලත්ව හදුනාගැනේ.
1998 වර්ෂයට පෙර අත්පත්කර ගත් දේපල, පිරියත හා උපකරණ වල වටිනාකම 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන වටිනාකමට පිළියෙල කර ඇත. ප්‍රත්‍යාගණන වටිනාකම ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනයේදී පැවති සාධාරණ වටිනාකම ලෙස අධිකාරිය විසින් භාරගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ තීරණය කරන ලද පිරිවැය සමුච්චිත ක්ෂවීම් අඩුකිරීමෙන් පසුව හාණි පාඩු ලෙස සටහන් කරනු ලැබේ. 1998 වර්ෂයෙන් පසුව අත්පත් කර ගන්නාලද දේපළ, පිරියත හා

උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂවීම් අඩු කිරීමෙන් පසුව හාණි පාඩු ලෙස ගණනය කරනු ලැබේ.

වත්කමක් මිලදී ගැනීමෙන් පසුව දරනු ලබන පිරිවැය එම අයිතමය මගින් අධිකාරියට අනාගත ආර්ථික වාසි සමග ඒකාබද්ධව විශ්වාසයකින් ගණනය කල හැකි නම් එයද වත්කමෙහි වටිනාකම ලෙස හදුනාගනු ලබන අතර, අනිකුත් සියළුම අලුත් වැඩියා සහ නඩත්තු සඳහා දරනු ලබන ගාස්තු එකී වියදම දරනු ලබන කාලපරිච්ඡේදයට අදාල විස්තීරණ ආදායම් ප්‍රකාශන වල දක්වනු ලැබේ.

ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර අනෙකුත් වත්කම් සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කරනු ලබන අතර පහත සඳහන් අයුරු වත්කමෙහි ඇස්තමේන්තුගත ජීව ආයුකාලය මත එහි ක්ෂයවීම් බෙදාහරිනු ලැබේ.

| **අයිතමය** | **ආයු කාලය** | **ක්ෂය අනුපාතය** |
|---|---|---|
| ගොඩනැගිලි | වර්ෂ 30 – 50 | 2% - 3.33% |
| වෙන්කිරීම් | වර්ෂ 3 | 33.33% |
| පර්යේෂණාගාර හා ස්වර්ණාභරණ පරික්ෂණ උපකරණ | වර්ෂ 10 | 10% |
| ලී බඩු සහ කාර්යාල උපකරණ | වර්ෂ 10 | 10% |
| රථ වාහන | වර්ෂ 4 | 25% |
| පරිගණක උපකරණ | වර්ෂ 5 | 20% |
| අනිකුත් වත්කම් | වර්ෂ 10 | 10% |

වත්කමෙහි ඇස්තමේන්තුගත වටිනාකමට වඩා ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම වැඩිවන්නේ නම්, වත්කමෙහි ඉදිරියට ගෙන එන වටිනාකම පියවාගත හැකි වටිනාකමට ලියා හරිනු ලැබේ.

1.3.4. **අස්පෘශ්‍ය වත්කම්**

පරිගණක වැඩ සටහන් හා පරිගණක පද්ධති අත්පත්කර ගැනීමට හා ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට ගෙන ඒම සඳහා දරනු ලබන පදනම මත පරිගණක වැඩ සටහන් හා පරිගණක පද්ධති ප්‍රාග්ධනිත කරනු ලැබේ. මිලදී ගත් අස්පෘශ්‍ය වත්කම් ඒවා මිලදී ගැනීමට දරන ලද වියදමෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හාණි වූ වටිනාකම අඩුකිරීමෙන් පසු දක්වනු ලැබේ. මෙම පිරිවැය පහත සඳහන් අයුරු ඇස්තමේන්තු ගත ආයු කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| පරිගණක පද්ධති | වර්ෂ 5 | 20% |

පරිගණක පද්ධති නඩත්තු සඳහා දරනු ලබන පිරිවැය වියදම් වශයෙන් හදුනා ගනු ලැබේ.

1.3.5. **කල් බදු ඉඩම්**

කල් බදු යටතේ දරනු ලබන ඉඩම් පලමුවෙන්ම බදු ගෙවීම් වටිනාකම වර්ධනය වන ණය අනුපාතයන් යටතේ වට්ටම්කර එයට ආරම්භක මූලික පිරිවැය හා ඉන් පසුව දරන්නට සිදුවන පිරිවැය එකතුකර වර්තමාන වටිනාකම සමාන වන පරිදි ගණනය කරනු ලබන අතර කල්බදු ඉඩම් ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. කල්බදු ඉඩම් වල වටිනාකම කල් බදු කාලසීමාව තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| කල් බදු ඉඩම් | වර්ෂ 30 | 3.33% |

1.3.6. **මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීම**

සෑම වාර්තාකරනු ලබන කාල පරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය විසින් දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල අගය පිළිබද විමසා බැලෙන අතර, එම වත්කම්වල අගය අඩු

වීමක් පෙන්නුම් කෙරේද යන්න තීරණය ලැබේ. එවැනි ලක්ෂණයක් පෙන්නුම් කෙරේ නම්, එම වත්කම් මගින් ආවරණය කරගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කර අගය අඩුවීම තීරණය කෙරේ.

විකුණුම් පිරිවැය වත්කමේ සාධාරණ අගයෙන් අඩු කිරීමෙන් පසු ආවරණය වන වටිනාකම වැඩි නම් අගය භාවිතයට ගැනේ. භාවිතා කිරීමේ ඇස්තමේන්තු අගය, අනාගත අස්තමේන්තු මුදල් ප්‍රවාහ වර්තමාන මුදල් ප්‍රවාහ වර්තමාන වටිනාකම අනාගත බඳු වට්ටම් අනුපාතයෙන් ගණනය කරන අතර එම මුදල් වල වර්තමාන තක්සේරු අගය හා විශේෂ අවධානම් තක්සේරු කරනු ලැබුවද එය අනාගත මුදල් ප්‍රවාහයට ගැලපීම් නොකෙරේ.

වත්කමෙහි දරනු ලබන වටිනාකම ආවරනය කරගත හැකි ඇස්තමේන්තු වටිනාකමට අඩුනම්, දරනු ලබන වටිනාකම ආවරණය කරගත හැකි වටිනාකම දක්වා වත්කමෙහි වටිනාකම අඩු කරනු ලැබේ. අගය අඩුවිමේ පාඩුව විස්තීර්ණ මුදල් ප්‍රකාශයන්හීදී හඳුනාගනු ලැබේ.

## 1.4 මූල්‍ය වත්කම්

### 1.4.1. වර්ගීකරණය

අධිකාරියෙහි මූල්‍ය වත්කම් හඳුනාගැනීම අනුව පහත සඳහන් අයුරු වර්ගීකරණය කරනු ලැබේ

i. ණය හා ලැබිය යුතු දෑ
ii. විකුණාගත හැකි දෑ (AFS)
iii. කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන (HTM)

**i. ණය හා ලැබිය යුතු දෑ**

ක්‍රියාකාරි වෙළඳ පොළෙහි මිල නියම නොකරන ලද, ස්ථිර හෝ තීරණය නොකරන ලද මූල්‍ය වත්කම් වලින් පැවත එන දෑ ණය හා ලැබිය යුතු දෑ වේ. වාර්තා කරනු ලබන කාල පරිච්චේදය ඉක්මවා මාස 12 ට වැඩි කාලයකින් කල් ඉකුත් වන දෑ හැර අනිකුත් ණය හා ලැබිය යුතු දෑ ජංගම වත්කම් වල ඇතුලත්ව ඇත. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය අවසානයේ අධිකාරියෙහි පැවති වෙළඳ හා අනිකුත් ලැබිය යුතු දෑ, රාජ්‍ය සුරැකුම් පත් නැවත මිලදී ගැනීම්, තැන්පත්, සේවක ණය හා මුදල් සහ මුදල් සමානදෑ වලින් ණය හා ලැබිය යුතු දෑවලින් සමන්විතවේ.

**ii. විකුණාගත හැකි දෑ (AFS)**

මෙකී වර්ගයට නියම කරන ලද හෝ වෙනත් කිසිදු වර්ගයකට වර්ගීකරණය නොකරන ලද නමුත් පැවත එන මූල්‍ය වත්කම් විකිණිය හැකි ආයෝජන යටතය ගැනේ. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයෙන් පසු මාස 12 ක් තුල විකිණීමට තීරණය නොකරන ලද හෝ කල් පිරෙනු ලබන ජංගම වත්කම් ගණයට නොවැටෙන දේ මෙයට ඇතුලත්වේ.විකිණිය හැකි මූල්‍ය වත්කම් දිගුකාලීන ලැයිස්තගත නොවූ ස්කන්ධ ආයෝජනවලින් සමන්විතවේ.

**iii. කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන (HTM)**

තීරණය කරනු ලබන හෝ ස්ථිර ගෙවීමක් ලබන සහ ස්ථිරව කල් පිරෙනු ලබන ණයහා ලැබිය යුතු දෑ කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජනලෙස තීරණය කරනු ලැබේ. අධිකාරිය විසින් දැනට කල් පිරෙන තෙක් රඳවාගනු ලබන, යහපත් දැක්මක් ඇති නම් එම ආයෝජනයන් කල්පිරීම තෙක් රඳවා ගන්නා ආයෝජන ලෙස වර්ගීකරනය කරනු ලැබේ.

මෙම ආයෝජනයන් වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය අවසන් වීමෙන් පසු මාස 12ක කාලයක් නොඉක්මවන කාලයක් තුල කල් පිරෙනු ලබන අතර ඒවා ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කෙරේ. අධිකාරිය දැනට භාණ්ඩාගාර බිල්පත් වල කර ඇති ආයෝජන මේ යටතට ගැනේ.

1.4.2 **හඳුනා ගැනීම් සහ මූලික ගණනය කිරීම්**

ණය හා ලැබිය යුතුදෑ පිළිබඳ ගණුදෙණුවක් ආරම්භවන දිනයේදී අධිකාරිය විසින් එයමූල්‍ය වත්කම් ලෙස හඳුනාගැනේ. අධිකාරිය මූල්‍ය උපයෝජනය සඳහා ගිවිසුම් වලට එලඹී එහි එක් පාර්ශවකරුවෙකු වන දිනයේදී අනිකුත් මූල්‍යවත්කම් හඳුනාගැනේ.

මූල්‍ය වත්කමක් එහි සාධාරණ අගයට පෙන්නුම් නොකෙරේ නම්, ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගය කෙලින්ම හුවමාරු කිරීමේ පිරිවැය ස්වභාවයද සැලකිල්ලට ගෙනමූල්‍ය වත්කම් මූලිකව ගණනය කරනු ලැබේ.

මූල්‍ය වත්කම් කල් පිරීම හෝ හුවමාරු කිරීම සිදුවන අවස්ථාවේදී මුදල් ප්‍රවාහයන් ලැබීම හෝ හිමිකම් ඇතිවන අවස්ථාවේදී නැවත හඳුනා ගැනෙන අතර පසුවඅධිකාරිය මූල්‍ය වත්කම්වල අයිතිය මතසියළුඅවධානම් සහ යහපත් ප්‍රථිඵලයන් මාරු කරනු ලැබේ.

1.4.3 **දෙවනුව ගණනය කිරීම්**

i. **ණය සහ ලැබිය යුතු දෑ**

මූලික හඳුනාගැනීමෙන් පසුව ණය හා ලැබිය යුතු දෑ බල පැවැත්වෙන පොලී අනුපාතයන් මත ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමය භාවිතාකර හාණි හා පාඩු සඳහා වෙන් කිරීම් අඩුකර දෙවනුව ගණනය කෙරේ.

ii. **විකුණාගත හැකි දෑ (AFS)**

මූලික හඳුනාගැනීමෙන් පසුව ලැයිස්තු ගත නොවූ ආයෝජන විකුණාගතහැකි මූල්‍ය වත්කම් එහි වර්තමාන වටිනාකම නියත වශයෙන් ඇස්තමේන්තු කල නොහැකි විට පිරිවැයෙන් කුමන හෝ වෙළඳ පල අගය නිසා ඇතිවන අලාභය අඩු කිරීමෙන්ද පසු ගණනය කරනු ලැබේ.

iii. **කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන (HTM)**

කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය, බල පැවැත්වෙන පොලී අනුපාතයන් භාවිතා කරමින් ලැබූ අගය ගණනය කිරීම් හාණි සහ පාඩු අඩු කිරීමෙන් පසුව ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේදී හා හුවමාරු පිරිවැය මත වට්ටම් සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ.

1.4.4 **මූල්‍ය වත්කම් මත හාණි හා පාඩු**

i. **වත්කම් ක්‍රමක්ෂය පිරිවැය මත දැක්වීම**

මූල්‍ය වත්කම් වල වටිනාකම හාණි වී තිබෙන බවට පිලිගත හැකි සාක්ෂි තිබේනම් වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය විසින් තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කමක අගය අඩුවී තිබේනම් එම හාණි වීමෙන් සිදුවූ අඩුවීම අඩංගුව ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබේ නම්ද, වත්කමක් හඳුනාගැනීමෙන් පසු සිද්ධීන් එකක් හෝ කිහිපයක ප්‍රථිඵලයක් ලෙස එය ඇතිවී ඇත්නම් සහ එකී පාඩු අවස්ථාව හෝ අවස්ථාවන්

අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රමාණයන්ට බලපෑමක් සිදු කෙරෙන විට එය පිළිගත හැකි ලෙස ඇස්තමේන්තු කෙරේ.

ණය හා ලැබිය යුතු දෑ කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජනයන් ඒවායේ හිලව් වන පිරිවැයට ගනු ලබන අතර වත්කම දරනු ලබන වටිනාකම සහ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම (ඇතුලත් නොවූ අනාගත බැර පාඩු හැර) අනුව අලාභය ගණනය කර එම මූල්‍ය වත්කම බල පවත්වන සත්‍ය පොලී අනුපාතය මත වට්ටම් කරනු ලැබේ.මූල්‍ය වත්කම්වල දරනු ලබන අගයෙන් හඳුනාගනු ලබන පාඩු අඩුකර එය විස්තීරණ ආදායම් ප්‍රකාශයන්ට ගණු ලැබේ.

පසු කාල පරිච්ඡේදයේදී හාණි පාඩු වටිනාකම අඩු වන්නේ නම් හාණි පාඩු සිදුවීමෙන් පසු අඩුවීම කෙලින්ම බලපානු ලබන්නේ නම්ද, එය හඳුනාගෙන විස්තීර්න ආදායම් ප්‍රකාශයන් මගින් පෙර හඳුනාගත් හාණි පාඩු වටිනාකම යථා තත්ත්වයට ගෙන එනු ලැබේ.

ii. **විකුණාගත හැකි දෑ (AFS)**

මූල්‍ය වත්කමට හාණි පාඩු සිදුවී ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබේනම් වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය එය තක්සේරු කරනු ලැබේ. ලැයිස්තුගත නොකල ආයෝජනයන් සඳහා, ආයෝජනයන්ගේ වටිනාකම සැලකිය යුතු හෝ දිග්ගැසුනු පිරිහීම පිළිබද සාක්ෂි ඇත්නම් පවා වත්කම අගය අඩු කරනු ලැබේ. මිල නියම නොකල ආයෝජනයන් සඳහා එවැනි සාක්ෂි තිබේනම්, මූල්‍ය වත්කම දරනු ලබන වටිනාකම සහ වෙනත් එවැනි වත්කමක් සඳහා වර්තමාන ඉපයීම් වෙළඳපල අනුපාතය මගින් අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයන් වට්ටම්කිරීමෙන් ලැබෙන වර්තමාන අගය අතර වෙනසගණනය කර හාණි පාඩු සිදුවූ වටිනාකම ගණනය කරනු ලැබේ.එවැනි හාණි පාඩු යථා තත්ත්වයට පත් කරනු නොලැබේ.

**1.5 භාණ්ඩ තොග**

පලමු ලැබීම් පලමු නිකුත් කිරිම් (FIFO)පදනම මත පිරිවැය තීරණය කර ශුද්ධ උපලබ්ධි අගය හෝ ගත්මිල යන දෙකෙන් අඩු අගය මත තොගයන් දක්වා ඇත. පාරිභෝගික භාණ්ඩ සහ ලිපිද්‍රව්‍ය වලින් තොග සමන්විතවේ.

**1.6 ලැබිය යුතු දෑ**

ලැබිය යුතු දෑ මුලින්ම එහි සත්‍ය වටිනාකම් මත (ඉන්වොයිස් අගය) හඳුනා ගැනීමද, ඉන් පසුව මුල් ඉන්වොයිස් වටිනාකම කෙටි කාලයක් තුල ආපසු ලැබේයයි බලාපොරොත්තුවෙන් වෙළඳ පල වටිනාකම සලකා එයින් හාණි සඳහා අඩු කිරීමද සිදු කරන අතර, මුදල් වල කාලීන වටිනාකම සැලකිල්ලට නොගැනේ.

වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදිම ආපසු ලැබිය යුතු දෑ වල වෙළඳ පල වටිනාකම වෙනස්වීම් වලට අදාල සාක්ෂි තිබේදැයි අධිකාරිය විසින් තීක්ෂණව තක්සේරු කරනු ලැබේ. අධිකාරියෙහි පසු ගිය අත්දැකීම් අනුව මුදල් එකතු කිරීමේ සහ ලැබීම් ප්‍රමාද සංඛ්‍යාව, ලැබීම්වල අගය අඩුවීමක් තිබේනම් එම හාණි පාඩු ඇතුලත් වන බවට පිළිගත හැකි සාක්ෂි තිබේනම් ලැබිය යුතු දෑ හාණි පාඩු සඳහා වෙන වෙනම තක්සේරු කරනු ලැබේ.

**1.7 මුදල් හා මුදල් සමානදෑ**

මුදල් හා මුදල් සමානදෑ තුල අතැති මුදල්, බැංකු ඒක්ෂණ තැන්පතු, මාස තුනක් හෝ ඊට පෙර කල් පිරෙනු ලබන ආයෝජන සමග අනිකුත් ඉතා ඉහල ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන මූලික කල්පිරීමේ වටිනාකම් මත මුදල් ප්‍රවාහ තුල ඇතුලත් කර ඇත.

**1.8 දායකත්ව ප්‍රාග්ධනය**

ශ්‍රී ලංකා මැණික් සංස්ථාව විසින් අධිකාරිය ආරම්භයේදී පවරා දෙනු ලැබූ අගයයන් මගින් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය වේ.

**1.9 මූල්‍ය බැරකම්**

අධිකාරියෙහි මූල්‍ය බැරකම් අනිකුත් මූල්‍ය බැරකම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. අධිකාරියෙහි අනිකුත් මූල්‍ය බැරකම් වලට ගෙවිය යුතු දෑ, බලපත්‍ර සඳහා ලැබූ අත්තිකාරම්, මැණික් ගැරීමේ තැන්පතු හා අනිකුත් තැන්පත් ලැබීම් ඇතුලත්වේ. මූල්‍ය වත්කම් මුහුණත වටිනාකමට කෙලින්ම භුවමාරු පිරිවැයක් වෙත්නම් එයද ඇතුලත්ව මුලින්ම හඳුනා ගැනේ. මූලික හඳුනාගැනීමෙන් පසුව කෙටි කාලයක් තුලදී ආපසු ගෙවීමට බලාපොරොත්තුවන හිග මුදල්වල මූලික වටිනාකම අනුව ගණනය කර හදුනා ගැනීම සිදුකෙරේ.

කල් පිරීම, අවලංගු කිරීම, ගිවිසුම් ගත බැඳීම් වලින් නිදහස් වීම වැනි අවස්ථා වලදී අධිකාරිය නැවත මූල්‍ය බැරකම් හඳුනා ගැනේ.

**1.10 ප්‍රවර්තන හා විලම්භිත බදු**

කාල පරිච්ඡේදය තුල දරන ලද බදු වියදම් වල වර්තමාන හා විලම්භිත බදු අඩංගුවේ. අනිකුත් විස්තීරණ ආදායම් අයිතමයන් ප්‍රමාණයන් හැර විස්තීරණ ආදායම් ප්‍රකාශයන් මගින් ආදායම් බදු හඳුනාගැනේ. මෙම කරුණෙහිදී පවා විස්තීරණ ආදායම් ගිණුම මගින් බදු හඳුනාගැනේ. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය අවසානයේදී පවත්නා බදු නීතියට අනුව අධිකාරියෙහි ක්‍රියාකාරීත්වය මගින් උත්පාදනය වන බදු අයවන ආදයම් පදනම මත වර්තමාන බදු ගණනය සිදු කෙරේ. කළමණාකාරීත්වය විසින් සුදුසුතම බදු පදනම යටතේ බදු අධිකාරීන් වෙත ගෙවිය යුතු යැයි බලාපොරොත්තුවන බදු සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම් හා වගකීම් ඒවායේ දරනු ලබන වටිනාකම මත පැන නගින තාවකාලික වෙනස අනුව විලම්භිත බදු වගකීම හඳුනාගැනේ. බදු සඳහා ගනන් ගැනෙන ලාභ හෝ පාඩු මගින් ගිණුම් වලට බල පෑමක් සිදු නොවන ගණුදෙණු සිදුවන අවස්ථා වලදී හැර වත්කම් හා වගකීම් සම්බන්ධ ගණුදෙණු සිදුවන අවස්ථාවලදී විලම්භිත බදු ගිණුම් ගත නොකෙරේ. කාල පරිච්ඡේදය අවසන් වන දිනයට බල පවත්වන බදු අනුපාතයන් භාවිතයෙන් වත්කම් හා වගකීම් වල ඉදිරියට ගෙන යන නිරවුල් කලයුතු ශේෂය හා අපේක්ෂිත උපලබ්ධි මුදල මත පදනම්ව විලම්භිත බදු මුදල ගණනය කෙරේ.

විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ තාවකාලික වෙනස යෙදවීම මත අනාගත බදුගත ලාභය ලබාගැනීමේ සම්භාවිතාවයේ ප්‍රමානය මත පමණක් වීමය.

අනාගත බදු වත්කම් හා වගකීම් වර්තන බදුවලට එරෙහිව හිලව් කිරීම සඳහා නීතිමය බලාත්මක අයිතියක් තිබෙනම්, බදු අධිකාරීන් විසින් ආදායම් බදු පැනවීමේදී ඒ හා සම්බන්ධ වේනම් විලම්භිත බදු වගකීම් වර්තන බදු වගකීම් වලට එරෙහිව ලියා හැරේ.

### 1.11 සේවක ප්‍රතිලාභ

**(අ) නිශ්චිත දායකත්ව සැලසුම්**

සේවය අවසන් කිරීමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ වෙනුවෙන් අධිකාරිය විසින් ස්ථිර දායකත්ව මුදලක් වෙනත් ආයතනයක තැන්පත් කිරීම නිශ්චිත දායකත්ව සැලසුමට අයත්වේ. අධිකාරිය තවදුරටත් දායකත්ව ගෙවීම සඳහා නීතිමය හෝ වෙනත් සම්බන්ධිත බැදීම් කිසිවක් නොමැත. සේවක ප්‍රතිලාභ වියදම් ගෙවිය යුතු අවස්ථාවේදී එම දායකයන් හඳුනාගැනේ.

සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයන්ගේ දළ සේවා පාරිශ්‍රමිකයන් මත 15% දායක මුදලක්ද, සේවා නියුක්තියන්ගේ භාර අර මුදල සඳහා දළ සේවා පාරිශ්‍රමිකයන් මත 3% ක දායක මුදලක්ද අධිකාරිය විසින් දරනු ලැබේ.

**(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම**

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේදී නිශ්චිත ප්‍රතිලාභ වල එදිනට පවතින වටිනාකම මත අධිකාරියෙහි නිශ්චිත ප්‍රතිලාභ බැදීම් සම්බන්ධව ඇති බැදීයාව ගණනය කෙරේ. යෝජිත ඒකක වගකීම් ක්‍රමය අනුගමනය කරමින් ගණනය කිරීම් පාරිතෝෂික සූත්‍රය භාවිතා කරමින් සිදුකර නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැදියාව ගණනය කරනු ලැබේ. සේවකයන්ගේ වර්තමාන හා පසුගිය සේවා කාලය සහ උපයාගත් වැටුප අනාගත ඇස්තමේන්තු ප්‍රතිලාභ වල වර්තමාන වටිනාකම ගණනය මත නිශ්චිත ප්‍රතිලාභ බැදීම් තීරණය කරනු ලැබේ.

ගණනය කිරීම් වල වෙනස්වීම් මත පැන නගිනු ලබන ලාභය හෝ පාඩුව ඒවා පැන නගිනු ලබන කාල පරච්ඡේදය අවසන වර්තමාන සේවා පිරිවැය හා පොලිය විස්තීරණ ආදායම් ප්‍රකාශ වලට ඇතුලත්වේ.

විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් සඳහා පිටතින් මුදල් සපයා ගණු නොලැබේ.

**(ඇ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ**

සේවකයා විසින් සපයන ලද සේවය පදනම් කරගෙන ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂා කරනු ලබන වට්ටම් නොකරන ලද මුදල මත කෙටිකාලීන සේවක ප්‍රතිලාභ බැදීම ගණනය කරනු ලැබේ.

### 1.12 ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම්

නිශ්චිත වශයෙන් ගණනය කල හැකි හා ආර්ථික සම්පත් ඉවතට ගලායාමේ සම්භාවිතාවක් ඇති බව පසුගිය සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස නීතිමය අයුරින් හෝ වටහා ගතහැකි පරිදී වර්තමාන බැදීම් අධිකාරියට ඇතිවිට නීතිමය ඉල්ලීම් මත ප්‍රතිපාදන හා අනිකුත් ක්‍රියාකාරි වියදම් හඳුනාගැනේ.

වාර්තා කරනු ලබන දිනය වන විට පිළිගත හැකි සාක්ෂි තිබේනම් හා වර්තමාන බැදීම් සමග අවධානම සහ අවිනිශ්චිතාව සම්බන්ධ වී ඇතුලත්ව තිබේ නම්, වර්තමාන බැදීම් පියවීම සඳහා අවශ්‍යවන ඇස්තමේන්තුගත වියදම් අනුව ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

සම්පත් ඉවතට යාමේ සම්භාවිතාවයක් නොමැති නම් සියළු අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

### 1.13 අදායම් හඳුනා ගැනීම

ලැබිය යුතු හා ලැබු මුදල්වල සාධාරණ අගය සැලකිල්ලට ගෙන ආදායම් ගණනය කරන අතර මැණික් ගැරීමේ අයිතිය අලෙවි කිරීම, බලපත්‍ර ගාස්තු, නිර්යාත කොමිස් හා සේවා සැපයීම් වෙනුවෙන් ලැබිය යුතු

මුදල්, එකතු කල අගය මත බදු (VAT) හා ජාතිය ගොඩනැගීමේ බදු (NBT) අඩු කිරීමෙන්පසු දක්වා ඇත. ආදායම් නිශ්චිත ලෙස ගණනය කල හැකි විටදී සහ අධිකාරිය වෙත අනාගතයේදී ආර්ථික පහසුකම් ලගා වේනම් ආදායම් හදුනා ගැනේ.

අධිකාරිය විසින් ප්‍රධාන වර්ගයේ සේවා සැපයීම් වෙනුවෙන් වූ ආදායම් හදුනාගැනීම පහත සදහන් පරිදී යොදා ගැනේ.

**(අ) මැණික් ගැරීමේ අයිතිය අලෙවිය (ඉඩම් වෙන්දේසි)**

මැණික් ගැරීමේ අයිතිය අලෙවි කිරීමේදී මැණික් ගැරීම සඳහා ඉඩම් කැබලි වෙන්කර බලපත්‍ර ලබාදීම,මිල ගණන් කැඳවීමේ ක්‍රමය අනුගමනය කර සිදුකෙරේ. මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදී අදායම් හදුනාගැනේ.

**(ආ) බල පත්‍ර ගාස්තු - මැණික් කැපීමේ සහ මැණික් අලෙවි බලපත්‍ර**

බල පත්‍රයේ කාල සීමාව අනුව ඍජු ක්‍රමය යටතේ බලපත්‍ර ගාස්තු ආදායම් හදුනාගැනේ.

**(ඇ) බල පත්‍ර ගාස්තු - මැණික් ගැරීමේ, යන්ත්‍ර මගින් මැණික් ගැරීමේ (BACO) සහ මැණික් වෙන්දේසි බලපත්‍ර**

මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදි බලපත්‍ර ගාස්තු ආදායම් හදුනාගැනේ.

**(ඈ) මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත කොමිස් - ( නිර්යාත සේවා ගාස්තු සහ කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු)**

භාණ්ඩ නිර්යාත කිරීමට සුදානම් කල අවස්ථාවේදී නිර්යාත කොමිස් ආදායම් ලෙස හදුනාගැනේ.

**(ඉ) සේවා**

මැණික් ඉඩම් පරීක්ෂා කිරීම වෙනුවෙන් වූ ආදායම් ගෙවීම් ලැබෙන අවස්ථාවේදී ආදායම් ලෙස හදුනා ගැනේ.

**(ඊ) කුලී ආදායම්**

බදු කොන්දේසි සැලකිල්ලට ගෙන උපචිත පදනම මත කුලී ආදායම හදුනා ගැනේ.

**(උ) පොළී ආදායම්**

ක්‍රියාත්මක වන පොලී ක්‍රමය මත පොළී ආදායම් හදුනාගැනේ.

**(ඌ) ලාභාංශ ආදායම්**

ගෙවීම් කිරීම තහවුරු කරනු ලබන අවස්ථාවේදී ලාභාංශ ආදායම් හදුනාගැනේ.

**(එ) දේපළ, පිරියත හා උපකරන ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු**

ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු තීරණය කිරීම එම වත්කමෙහි දරනු ලබන අගය සහ විකුණා ලැබෙන මුදල සමග සැසඳීමෙන් පසුව විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හීදී සිදුකෙරේ.

**1.14 වියදම්**

වාර්තා කරනු ලබන කාලපරිච්ජේයට අදාලව ලාභ ඉපයීම සඳහා ආයතනයේ මෙහෙයුම් පවත්වාගෙන යාමට දරනු ලබන සියළු වියදම් ඇතුලත්වේ.

**1.15 වාර්තා කරනු ලබන කාලයට පසු සිදුවීම්**

වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයට පසු සිදුවීම් වල ප්‍රමාණාත්මක බව සලකා අවශ්‍ය පරිදි ගැලපීම් සිදුකර හෝ මූල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

**1.16 බැදීම්**

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේ පවතින සියළු ප්‍රමාණාත්මක බැදීම් හදුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට සටහන් මගින් හෙළිදරව් කර ඇත.

**1.17 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණයන්**

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී කළමණාකාරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හදුනා ගැනීමට සහ ඒවා ගණනය කිරීම සඳහා බොහෝ තීරණයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදුකර ඇත.

i. මූල්‍ය ප්‍රකාශනවලට බොහෝ බලපෑම් ඇති කරනු ලබන ගිණුම් ප්‍රමිත භාවිතා කිරීමේදී පහත සඳහන් වැදගත් තීරණයන් ගනු ලැබිය.

(අ) **විලම්භිත බදු වත්කම් හදුනාගැනීම**

වත්කම්වල අනාගත ප්‍රයෝජනයට ගතහැකි අගයට එරෙහිව අනාගතයේ බදු ආදායමක් ලැබීමේ සම්බන්ධතාවයක් පවතිනම් එම වත්කම් එම ප්‍රමාණයට පමණක් විලම්භිත බදු වත්කම හදුනාගැනේ.

ii.වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හදුනාගැනීම සහ ගණනය කිරීම් වලදී බොහෝ වැදගත් සිදුවීම් සඳහා ඇස්තමේන්තු සහ උපකල්පනයන් පිළිබද තොරතුරු පහත දක්වා ඇත.

(අ) **ක්ෂය වන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය**

වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම ක්ෂය වන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ඇස්තමේන්තු කිරීමේදී එම වත්කමෙහි යෝජිත ආර්ථික භාවිතය පදනම්ව කළමනාකාරිත්වය සලකා බලනු ලැබේ. මෙම ඇස්තමේන්තු වලදි තාක්ෂණිකව අභාවයට යෑම පිළිබද පරිගණක උපාංග හා පරිගණක මෘදුකාංග වල අවිනිශ්චිතතාවයක් පවතී.

(ආ) **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම**

උපකල්පනයන් ගණනාවක් භාවිතා කරමින් හා සාධක ගණනාවක් සැලකිල්ලට ගනිමින් යෝජිත ඒකක බැර පදනම මත නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැදීම් වල වර්තමාන වටිනාකම තීරණය කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැදීම් සහ ශුද්ධ පිරිවැය උපකල්පනය කිරීමේදී යොදාගන්නා වට්ටම් අනුපාතයන් සටහන් 22.1 මගින් හෙළිදරව් කර ඇත. නිශ්චිත ප්‍රතිලාභ බැදීම් වල වර්තන වටිනාකමට මෙම උපකල්පනයන්ගේ වෙනස්වීම් බලපානු ලැබේ.

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| | දායක ප්‍රාග්ධනය | මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල | ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල | මැණික් ත්‍යාග අරමුදල | අනිකුත් සංචිත | මැණික් ප්‍රත්‍යාගණන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපයුම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | **30,000,000** | **27,356,498** | **17,455,083** | **29,499,189** | **-** | **-** | **58,145,425** | **193,355,884** | **355,812,079** |
| සාධාරණ අගයට ගැලපීම් | - | - | - | - | - | 355,074,648 | - | - | 355,074,648 |
| වර්ෂය සදහා ලාභය | - | - | - | - | - | - | - | 185,117,560 | 185,117,560 |
| අනිකුත් විස්තීරණ ආදායම් | - | - | - | - | - | | - | - | - |
| විස්තීරණ ආදායම් එකතුව | - | - | - | - | - | - | - | - | 896,004,287 |
| වර්ෂය සදහා දායකත්වය/ (උපයෝජනය) | - | (129,000) | 6,202,398 | 3,803,702 | - | - | - | - | 9,877,100 |
| අගය අඩුවීමට ගැලපීම් | - | - | - | - | - | - | (5,200,000) | 5,200,000 | - |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | **30,000,000** | **27,227,498** | **23,657,481** | **33,302,891** | **-** | **355,074,648** | **52,945,425** | **383,673,444** | **905,881,387** |
| සාධාරණ අගයට ගැලපීම් | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය සදහා ලාභය | - | - | - | - | - | - | - | 59,162,844 | 59,162,844 |
| අනිකුත් විස්තීරණ ආදායම් | - | - | - | - | - | - | - | - | - |
| විස්තීරණ ආදායම් එකතුව | - | - | - | - | - | - | - | - | 965,044,231 |
| පෙර වර්ෂය සදහා ගැලපීම් | | | | | | | | (2,680,868) | (2,680,868) |
| වර්ෂය තුල දායකත්වය/ (උපයෝජනය) | - | (300,000) | 5,401,782 | 3,208,559 | - | - | - | - | 8,310,341 |
| හාණි පාඩු සදහා ගැලපීම් | - | - | - | - | - | - | - | - | - |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | **30,000,000** | **26,927,498** | **29,059,263** | **36,511,450** | **-** | **355,074,648** | **52,945,425** | **440,155,420** | **970,673,703** |

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

| 3 | දේපල, පිරියත හා උපකරණ පිරිවැයට | 2013 ජනවාරි 01 දිනට | එකතු කිරීම් | ඉවත් කිරීම් | 2013 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| | **බැඳීම් වලින් නිදහස්** | | | | |
| | ඉඩම් | 37,941,670 | - | - | 37,941,670 |
| | ගොඩනැගිලි | 153,108,406 | 291,861 | - | 153,400,267 |
| | සවිකිරිම් සහ උපකරණ | 12,594,781 | 770,600 | - | 13,365,381 |
| | ලීබඩු | 10,837,820 | 453,325 | (32,325) | 11,258,820 |
| | කාර්යාල උපකරණ | 13,777,267 | 1,239,629 | (449,500) | 14,567,396 |
| | පරිගණක | 17,728,446 | 2,007,450 | (391,683) | 19,344,213 |
| | පර්යේෂණාගාර උපකරණ | 18,315,510 | 2,340,989 | (70,100) | 20,586,399 |
| | මැණික් කැපිමේ උපකරණ | 403,475 | - | - | 403,475 |
| | ස්වර්ණාභරණ උපකරණ | 148,200 | - | - | 148,200 |
| | තත්ත්ව මුද්‍රා උපකරණ | 20,264,522 | 5,037,149 | - | 25,301,671 |
| | යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ | 8,292,358 | - | - | 8,292,358 |
| | රථ වාහන | 54,172,088 | 29,072,500 | - | 83,244,588 |
| | යතුරු පැදි | 100,000 | - | - | 100,000 |
| | පාපැදි | 37,334 | - | - | 37,334 |
| | පුස්තකාල පොත් | 6,900 | - | - | 6,900 |
| | **කල් බදු** | | | | |
| | ඉඩම් | 159,205 | - | - | 159,205 |
| | | **347,887,982** | **41,213,503** | **(943,608)** | **388,157,877** |

| | ක්ෂයවීම් | 2013 ජනවාරි 01 දිනට | වර්ෂයට අදාල | ඉවත් කිරීම් | 2013 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| | ගොඩනැගිලි | 32,320,002 | 3,995,403 | | 36,315,405 |
| | සවිකිරීම් සහ උපකරණ | 10,302,304 | 830,033 | | 11,132,337 |
| | ලීබඩු | 7,209,353 | 895,211 | (32,325) | 8,072,239 |
| | කාර්යාල උපකරණ | 6,740,281 | 1,185,540 | (127,191) | 7,798,630 |
| | පරිගණක | 11,272,039 | 2,052,982 | (391,683) | 12,933,338 |
| | පර්යේෂණාගාර උපකරණ | 8,330,784 | 1,695,027 | (70,100) | 9,955,711 |
| | මැණික් කැපිමේ උපකරණ | 247,515 | 32,200 | - | 279,715 |
| | ස්වර්ණාභරණ උපකරණ | 166,154 | - | (17,954) | 148,200 |
| | තත්ත්ව මුද්‍රා උපකරණ | 14,741,566 | 1,454,862 | - | 16,196, 428 |
| | යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ | 8,170,011 | 105,855 | - | 8,275,866 |
| | රථ වාහන | (470,793) | 12,986,015 | 31,771,320 | 44,286,542 |
| | යතුරු පැදි | 75,000 | 25,000 | - | 100,000 |
| | පාපැදි | 33,579 | 936 | - | 34,515 |
| | පුස්තකාල පොත් | - | - | - | - |
| | | **99,137,795** | **25,259,064** | **31,132,067** | **155,528,926** |

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

| දරන ලබන ශුද්ධ වටිනාකම | 2013 ජනවාරි 01 දිනට | 2012 දෙසැම්බර් 31 දිනට | 2012 ජනවාරි 01 දිනට |
|---|---|---|---|
| **බැඳීම් වලින් නිදහස්** | | | |
| ඉඩම් | 37,941,670 | 37,941,670 | 38,091,150 |
| ගොඩනැගිලි | 117,084,862 | 120,788,404 | 121,472,936 |
| සවිකිරීම් සහ උපකරණ | 2,233,044 | 2,292,477 | 2,880,032 |
| ලීබඩු | 3,186,581 | 3,628,467 | 4,601,836 |
| කාර්යාල උපකරණ | 6,768,767 | 7,036,986 | 5,198,862 |
| පරිගණක | 6,410,875 | 6,456,407 | 5,867,071 |
| පර්යේෂණාගාර උපකරණ | 10,630,688 | 9,984,726 | 3,330,898 |
| මැණික් කැපිමේ උපකරණ | 123,760 | 155,960 | 188,160 |
| ස්වර්ණාභරණ උපකරණ | - | (17,955) | (17,955) |
| තත්ත්ව මුද්‍රා උපකරණ | 9,105,243 | 5,522,956 | 5,911,173 |
| යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ | 16,492 | 122,347 | 805,383 |
| රථ වාහන | 38,958,045 | 54,642,881 | 13,703,672 |
| යතුරු පැදි | - | 25,000 | 50,000 |
| පාපැදි | 2,819 | 3,755 | 4,691 |
| පිළියෙල කිරීමේදී | 6,900 | 6,900 | 6,900 |
| **කල් බදු** | | | |
| ඉඩම් | 159,205 | 159,205 | 159,205 |
| | **232,628,951** | **248,750,186** | **202,254,914** |
| හාණි සඳහා ප්‍රතිපාදන | (4,887,690) | (2,934,756) | |
| | **227,741,261** | **245,815,430** | **202,254,914** |

මාර්ග සංවර්ධන අධිකාරියේ හෙළිදරව්කිරීම් අනුව ඇහැලියගොඩ ඉදිකරන ලද ගොඩනැගිල්ලේ නැවත විකිණීමේ වටිනාකම ලබාගත නොහැකි බැවින් සාධාරණ අගය හාණි සඳහා ප්‍රතිපාදන වලට මාරු කරන ලදී.

**4 කල්බදු ඉඩම් ඉඩම් භාවිතය සඳහා අයිතිය**

කල් බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම ණයට ගැනීම් සඳහා වූ වර්ධනය වන වට්ටම් අනුපාතය මත ගණනය කිරීමෙන් පසු වටිනාකමට කල්බදු ඉඩම් ඉඩම් භාවිතය සඳහා අයිතිය ගණනය කරනු ලැබේ.

| ඉඩම් භාවිතය සඳහා දරනවටිනාකම | 2013 | 2012 |
|---|---|---|
| **ප්‍රාග්ධනිත අගය** | | |
| ජනවාරි 01 දිනට | **70,909** | **70,909** |
| ඇතුලත් මුලික පිරිවැය | - | - |
| වර්ෂයතුල ප්‍රාග්ධනිත කිරීම් | - | 70,909 |
| දෙසැම්බර් 31 දිනට | **70,909** | **70,909** |
| **ක්‍රමක්ෂය** | | |
| ජනවාරි 01 දිනට | **37,818** | **35,455** |
| වර්ෂය තුල ක්‍රමක්ෂය වීම | 2,364 | 2,364 |
| දෙසැම්බර් 31 දිනට | **40,182** | **37,818** |
| **දරනු ලබන වටිනාකම** | **30,727** | **33,091** |

ඉඩම්වල කල්බදු අයිතිය 1997 නොවැම්බර් මස ආරම්භ වි අවරුදු 30 දක්වා වේ. කල්බදු කොන්දේසි අනුව 2026 නොවැම්බර් දක්වා වාර්ෂිකව ඉඩම් භාවිතය සඳහා වූ කල්බදු අයිතිය සංක්‍රාන්ති අවධිය වූ (2011 ජනවාරි 01) සිට ඉදිරි කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

| | | 2013 ජනවාරි 01 දිනට | එකතු කිරීම්/ ඉවත් කිරීම් | 2013 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| **5.** | අස්පෘශ්‍ය වත්කම් | | | |
| | 5.1 **පිරිවැයට** | | | |
| | පරිගණක මෘදුකාංග | 2,530,056 | - | 2,530,056 |
| | **එකතුව** | **2,530,056** | **-** | **2,530,056** |
| | | **2013 ජනවාරි 01 දිනට** | **වර්ෂය සඳහා වැය** | **2013 දෙසැම්බර් 31 දිනට** |
| | 5.2 **ක්‍රමක්ෂය** | | | |
| | පරිගණක මෘදුකාංග | 2,172,265 | - | 1,963,389 |
| | **එකතුව** | **2,172,265** | **-** | **1,963,389** |

| | | | 2013 ජනවාරි 01 දිනට | 2012 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| | 5.3 **දරණ ශුද්ධ අගය** | | | |
| | පරිගණක මෘදුකාංග | | 357,792 | 566,667 |

| | | | | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| **6.** | **විලම්භිත බදු වත්කම්/(වගකීම්)** | | | | |
| | ජනවාරි 01 දිනට ශේෂය | | | (16,062,221) | 7,011,667 |
| | ගැලපීම් | | | (2,230,123) | (23,073,888) |
| | **දෙසැම්බර් 31 දිනට ට ශේෂය** | | | **(18,292,344)** | **(16,062,221)** |
| **7.** | **අනිකුත් වත්කම්** | | | | |
| | රළු ගල් සහ සින්තටික් ගල් | | | 96,683 | 96,683 |
| | ප්‍රදර්ශන මැණික් ගල් | | | 371,842,648 | 371,842,648 |
| | මැණික් සහ මැණික් ආයතන වලට අත්තිකාරම් ගෙවීම් | | | 200,000 | 200,000 |
| | | | | **372,139,331** | **372,139,331** |
| | හාණි පාඩු සඳහා වෙන්කිරීම් | | | (200,000) | (200,000) |
| | | | | **371,939,331** | **371,939,331** |
| **8.** | **විකිණිය හැකි (AFS) මූල්‍ය වත්කම්** | | | | |
| | ලැයිස්තු ගත නොකල ආයෝජන | (සටහන් 8.1) . | | **1,200,000** | **1,200,000** |
| | **8.1 ලැයිස්තු ගත නොකල ආයෝජන** | කොටස් සංඛ්‍යාව | | | |
| | සීමා සහිත ලංකා එක්සත් පුවත්පත් සමාගම | 20,000 | | 200,000 | 200,000 |
| | ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා පුද්ගලික සමාගම | 100,000 | | 1,000,000 | 1,000,000 |
| | | | | **1,200,000** | **1,200,000** |
| **9.** | **භාණ්ඩ තොග** | | | | |
| | පාරිභෝගික භාණ්ඩ | | | 1,360,639 | 719,192 |
| | මැණික් - ගෙවුඩ මධ්‍යස්ථානය | | | 183,548 | 183,548 |
| | මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය තොග | | | 616,218 | 796,861 |
| | | | | **2,160,405** | 1,699,601 |

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **10.** | **ලැබිය යුතු දෑ** | | |
| | ලැබිය යුතු දෑ | 9,512,985 | 13,566,541 |
| | හාණි පාඩු සඳහා වෙන්කිරීම | (1,407,972) | (1,407,972) |
| | | **8,105,013** | **12,158,569** |
| | අනිකුත් | 1,291,121 | 152,216 |
| | | **9,396,134** | **12,310,785** |
| **11.** | **කල් පිරෙන තෙක් වූ ආයෝජන (HTM) ක්‍රමක්ෂය පිරිවැය මත දරන වටිනාකම** | | |
| | හාණ්ඩාගාර බිල්පත් | **216,381,558** | **191,609,933** |
| **12.** | **තැන්පතු සහ අත්තිකාරම්** | | |
| | පොදු තැන්පත් | 32,143,890 | 299,750 |
| | අනිකුත් | 19,525 | 2,401,790 |
| | නිවාස කුලී අත්තිකාරම් | - | 7,296,233 |
| | ඉඩම් වෙන්දේසි 40% | - | 22,090,642 |
| | ආරක්ෂිත තැන්පතු | 54,500 | 54,500 |
| | සැපයුම්කරුවන්ට ගෙවූ අත්තිකාරම් | 1,925,552 | 981,984 |
| | | **34,143,467** | **33,124,899** |
| | හාණි පාඩු සඳහා ප්‍රතිපාදන | (1,433,947) | (1,433,947) |
| | | **32,709,520** | **31,690,952** |
| **13.** | **සේවක ණය සහ අත්තිකාරම්** | | |
| | අත්තිකාරම් | 80,496 | 146,641 |
| | සුභ සාධක ණය සහ මරණාධාර ණය | - | - |
| | වැටුප් රහිත නිවාඩු | 169,332 | 232,259 |
| | වාහන ණය | 400,171 | 728,260 |
| | ණය | - | 5,955 |
| | රෙදිපිළි ණය | 186,522 | 252,556 |
| | ආපදා ණය | 12,823,229 | 12,384,206 |
| | | **13,659,749** | **13,749,877** |
| **14.** | **අනිකුත් මූල්‍ය වත්කම්** | | |
| | ස්ථාවර තැන්පත් | 625,854,003 | 541,699,421 |
| | රාජ්‍ය උගස් හා ආයෝජන බැංකු තැන්පත් (සේවක නිවාස ණය සඳහා) | - | - |
| | රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදල | 13,522,485 | 3,006,884 |
| | | **639,376,488** | **544,706,305** |
| **15.** | **මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| | මුදල් හා බැංකු ශේෂයන් - ශ්‍රී. ලං. රු. | 55,692,429 | 19,355,133 |
| | බැංකු ශේෂය (විදේශ ව්‍යවහාර මුදල්) | 37,119 | 3,659,811 |
| | සුළු මුදල් | - | - |
| | හාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන | 42,234,847 | 25,362,854 |
| | | **97,964,396** | **48,377,798** |

**16. දායක ප්‍රාග්ධනය**

ශ්‍රී ලංකා මැණික් සංස්ථාව විසින් අධිකාරිය ආරම්භයේදී පවරා දෙනු ලැබූ අගයයන් මගින් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය වේ.

**17. මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල**

මැණික් කර්මාන්තයේ නියුතු සේවකයන්ගේ ජීවිත අවධානම නිසා ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අධිකාරිය විසින් 1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 1 කොටසේ 14(එන්) වගන්තියට අනුකූලව 2008 වනතුරු මැණික් ගරන්නන්ගෙන් අරමුදල් එකතු කරන ලදී.

**18. ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල**

ස්වර්ණාභරණ කර්මාන්තයේ තාක්ෂණික සංවර්ධනය වෙනුවෙන් 2007 අයවැය යෝජනා අනුව ස්වර්ණාභරණ නිෂ්පාදකයින් ගෙන් වාර්ෂික ලියාපදිංචි ගාස්තුව වූ රු.5,000 බැගින් වූ මුදලින් මෙම අරමුදල සංයුක්තවේ.

**19. මැණික් ත්‍යාග අරමුදල**

1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ IV කොටසේ 52 වගන්තියේ අවශ්‍යතාවය අනුව අධිකාරිය වෙත ලැබෙන අපරාධ වෙනුවෙන් අදාල පාර්ශවයන්ගෙන් අයකරනු ලබන ගාස්තු සහ දඩ මුදල් දඩ අරමුදල වෙත බැර කිරීමෙන් මෙම අරමුදල සමන්විතවේ. අධ්‍යක්ෂ මණ්ඩල චක්‍රලේක අංක 824 උපදෙස් අනුව වැටලීම් කණ්ඩායම්වලට සහ සේවකයන්ට ත්‍යාග පිරිනැමීම සඳහා මෙම අරමුදල නඩත්තු කෙරේ.

**20. මැණික් ප්‍රත්‍යාගණන සංචිත**

මැණික් ප්‍රදර්ශන වලට ඉදිරිපත් කරනු ලබන මැණික් ගල් ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇතිවන අතිරික්ත වලින් සමන්විතවේ.

**21. ප්‍රත්‍යාගණන සංචිත**

ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම තුලින් ඇතිවන ප්‍රත්‍යාගණන අතිරික්තයන් ගෙන් ප්‍රත්‍යාගණන සංචිතය සමන්විත වන අතර ප්‍රත්‍යාගණනය කරන ලද එකිනෙක වත්කම් ඉවත් කිරීමේදී එම වත්කමට අදාල ප්‍රත්‍යාගණන අතිරික්ත වටිනාකම රඳවාගත් ඉපයුම් වලට මාරු කරනු ලැබේ.

**22.**

| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | 2013 | 2012 |
|---|---|---|
| **ජනවාරි 01 දිනට ශේෂය** | **18,607,015** | **29,571,319** |
| විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම් හඳුනාගැනීම සටහන් 22.1 | 8,115,151 | (115,661) |
| 2013 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම් | (2,726,309) | (10,848,643) |
| 2013 වර්ෂයට කල ගැලපීම් | - | - |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **23,995,857** | **18,607,015** |

| 22.1 විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම් හඳුනාගැනීම | | |
|---|---|---|
| පොලී වියදම | 1,979,786 | 3,548,558 |
| වර්ෂය තුල අයකිරීම් | 1,107,708 | 756,216 |
| උපකල්පනයන්ගේ වෙනස්වීම් තුලින් පැන නගින (ලාභ /අලාභ) | 5,027,657 | (4,420,436) |
| | **8,115,151** | **(115,661)** |

විශ්‍රාම ප්‍රතිලාභ ගණනය කිරීමේදී කළමනාකාරීත්වයේවඩාත් උචිත විචලා ඇස්තමේන්තු පදනම් කරගෙන අධිකාරිය මෙම උපකල්පනයන් සංවර්ධනය කෙරේ.

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

**භාවිතා කරනු ලබන මූලික උපකල්පනයන් පහත දැක්වේ**

| | | |
|---|---|---|
| වට්ටම් අනුපාත | 11 | 12 |
| අනාගත වැටුප් වැඩිවීම් සාමාන්‍ය වේතන (%) | 1.3 | 1.3 |
| සේවක පිරිවැටුම් සාධකය (%) | 2.5 | 7.2 |
| විශ්‍රාම යන වයස (අවුරුදු) | 60 | 60 |

දිගුකාලීන රජයේ බැඳුම්කර වෙළඳ අනුපාත සදනම මත වට්ටම් අනුපාත තීරණය කරනු ලැබේ.

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **23.** | **කල්බදු ගෙවීම් සඳහා වූ වගකීම** | 2013 | 2012 |
| | **දළ වගකීම** | | |
| | **ජනවාරි 01 දිනට** | **599,564** | **625,889** |
| | වර්ෂය තුල හඳුනා ගැනීම් | - | - |
| | වර්ෂය තුල ගෙවීම් | (26,325) | (26,325) |
| | **දෙසැම්බර් 31 දිනට** | **573,239** | **599,564** |
| | | | |
| | **මූල්‍ය පිරිවැය** | | |
| | **ජනවාරි 01 දිනට** | **583,829** | **608,019** |
| | වර්ෂය තුල හඳුනාගැනීම් | - | - |
| | වර්ෂය තුල විස්තීරණ ආදායම තුල මූල්‍ය පිරිවැය හඳුනාගැනීම | (24,500) | (24,190) |
| | **අනාගතකාලපර්ච්ඡේදය සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය** | **559,329** | **583,829** |
| | | | |
| | **දෙසැම්බර් 31 දිනට ශුද්ධ වගකීම** | **(13,910)** | **15,735** |
| | **23.1 වගකීම් වර්ගීකරණය** | | |
| | වර්ෂයක් තුල පියවිය යුතු | | |
| | දළ වගකීම් | 26,995 | 26,995 |
| | අනාගත කාල පරිච්ඡේද සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය | (24,765) | (24,500) |
| | | **2,230** | **2,495** |
| | **වර්ෂය ඉක්මවූ** | | |
| | **පියවීම වර්ෂ දෙකත් සහ පහත් අතර** | | |
| | දළ වගකීම් | 131,625 | 118,463 |
| | අනාගත කාල පරිච්ඡේද සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය | (126,444) | (112,970) |
| | | **5,181** | **5,493** |
| | පියවීම වර්ෂ පහ ඉක්මවූ | | |
| | දළ වගකීම් | 414,619 | 454,106 |
| | අනාගත කාලපරිච්ඡේද සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය | (408,120) | (446,358) |
| | | **6,499** | **7,748** |
| | **වර්ෂයක් ඉක්මවා පියවිය යුතු වගකීම් එකතුව** | **11,680** | **13,241** |
| | **දෙසැම්බර් 31 දිනට ශුද්ධ වගකීම් එකතුව** | **13,910** | **15,736** |

| | | | |
|---|---|---|---|
| **24.** | **ගෙවියයුතු** | | |
| | ණයහිමියෝ | 62,031,660 | - |
| | කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවාගත් මුදල් | 2,568,873 | 2,568,873 |
| | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හා ඉඩම් හිමියන් වෙත ගෙවිය යුතු මැණික් ඉඩම් වෙන්දේසියේ ලැබුණු මුදලින් 40% | - | 35,152,480 |
| | අනිකුත් | 115,325 | 451,451 |
| | | **64,715,858** | **38,172,804** |

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

| | | | 2013 | 2012 |
|---|---|---|---|---|
| **25.** | **තැන්පතු සහ අත්තිකාරම් ලැබීම්** | | | |
| | අත්තිකාරම් ලැබීම් | | 1,668,387 | 1,054,223 |
| | බලපත්‍ර 28 ගාස්තු | | 15,243,550 | 14,591,919 |
| | සේවක ආරක්ෂිත තැන්පතු | | 114,500 | 69,500 |
| | ගණුදෙණු කරුවන්ගේ අත්තිකාරම් | | 15,896 | 15,896 |
| | සේවකයන්ගේ වැඩිපුර අයකර ගැනීම් | | 3,066 | 6,258 |
| | ඉඩම් ආරවුල් තැන්පතු | | 53,378,475 | 44,863,550 |
| | ටෙන්ඩර් තැන්පතු | | 14,103,500 | 2,880,500 |
| | ලෝක වෙළද මධ්‍ය. වෙලද කුටි රඳවා ගැනීම් | | 11,474,385 | 8,396,463 |
| | වෛද්‍ය යෝජනාක්‍රම අරමුදල | | 280,000 | 280,000 |
| | නිර්යාත කොමිස් තැන්පතු | | 125,997 | 125,997 |
| | අනිකුත් | | 45,000 | - |
| | | | **96,452,755** | **72,284,306** |
| **26.** | **ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ** | | | |
| | සංස්ථාපිත බදු | (සටහන් 26.1) | 60,105,954 | 137,395,277 |
| | එකතුකල අගය මත බදු | | 8,736,530 | 3,838,508 |
| | රඳවාගත් බදු | | (3,017,710) | - |
| | රඳවාගත් මැණික් වෙන්දේසි බදු 2.5% | | 22,633,413 | 23,137,224 |
| | ජාතිය ගොඩනැගිමේ බද්ද | | 1,782,649 | 632,041 |
| | මුද්දර ගාස්තු | | 2,432,636 | 1,397,995 |
| | උපයන විට බදු | | (35,085) | 61,177 |
| | | | **92,638,388** | **166,462,222** |
| | **26.1 සංස්ථාපිත බදු** | | | |
| | ජනවාරි 01 දිනට ශේෂය | | 1,414,921 | 1,781,603 |
| | වර්ෂය සඳහා වර්ථන බදු | | 58,691,033 | 142,736,852 |
| | වර්ෂයතුල ගෙවීම් - පසුගිය වසර බැදීම් පියවීම | | - | (1,781, 603) |
| | ස්ව තක්සේරු ගෙවීම් | | - | (2,000,000) |
| | බදු බැර පියවීම් - ආර්ථික සේවා ගාස්තු | | - | (3,325,782) |
| | - රඳවාගත් බදු | | - | (15,793) |
| | - ජාතිය ගොඩනැගීමේ බදු | | - | - |
| | පසුගිය වර්ෂය සඳහා වූ අධි/(ඌණ) වෙන්කිරීම් මත ගැලපීම | | - | - |
| | | | **60,105,954** | **137,395,277** |
| **27.** | **වෙන්කිරීම් සහ උපචිත වියදම්** | | | |
| | නිත්‍යානුකූල හිමිකම් සඳහා වෙන්කිරීම් | | 195,300 | 195,300 |
| | උපචිත වියදම් | | 19,265,460 | 20,469,928 |
| | | | **19,460,760** | **20,665,228** |

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
### 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **28.** | **ආදායම්** | | |
| | ඉඩම් වෙන්දේසි - රජයේ ඉඩම් | 7,672,714 | - |
| | ඉඩම් වෙන්දේසි - ඉඩම් ප්‍ර.කොමි. | 15,114,475 | 275,388,480 |
| | සේවා සහ බලපත්‍ර අභියාචන ගාස්තු | 763,440 | 829,450 |
| | මැණික් ගැරීමේ බලපත්‍ර ගාස්තු | 37,148,274 | 31,176,659 |
| | වෙළදාම් බලපත්‍ර ගාස්තු | 30,364,822 | 24,667,610 |
| | ත්‍යාග සහ සාම්පල් සඳහා සේවා ගාස්තු | 222,000 | 283,078 |
| | මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත සේවා ගාස්තු | 96,606,783 | 95,763,490 |
| | මැණික් කැපීමේ බලපත්‍ර ගාස්තු | 207,800 | 223,290 |
| | ගෙවුඩ නිර්යාත සේවා ගාස්තු | 3,438,550 | 982,807 |
| | LDO ඉඩම් සහ බණිජ බද්ද | 4,621,500 | 4,663,800 |
| | දඩ මගින් ආදායම් | 11,862,249 | 13,430,708 |
| | මැණික් වෙන්දේසි බලපත්‍ර | 638,200 | 380,200 |
| | මැණික් පරීක්ෂා කිරීමේ ගාස්තු | 7,310,998 | 5,592,666 |
| | තත්ත්ව මුද්‍රා කාර්යාලයේ ආදායම් | 4,014,743 | 4,506,246 |
| | බලපත්‍ර පිටපත් ගාස්තු | 98,200 | 160,500 |
| | කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු | 10,224,552 | 13,245,734 |
| | මැණික් පාර්සල් නිශ්කාශණයෙන් ආදායම් | 1,410,000 | 1,054,735 |
| | විදේශ විනිමය භාර ගැනීමේ බලපත්‍ර | 293,321 | 301,925 |
| | පාරිසරික ආරක්ෂණය | (452,407) | 335,000 |
| | BACO සේවා ගාස්තු | 25,185,500 | 15,906,100 |
| | පරීක්ෂණ ගාස්තු | 67,172,600 | 31,170,875 |
| | ත්‍රිමාන කාඩ් සහ වර්ණ | 1,977,287 | 1,256,018 |
| | මැණික් වෙළදාම | 39,697,648 | 3,644,185 |
| | මැණික් ගැරීමේ දඩ | 5,102,250 | 5,245,000 |
| | | **370,695,500** | **530,208,556** |
| | | | |
| **29.** | **අනිකුත් ආදායම්** | | |
| | විවිධ ආදායම් | 1,664,792 | 3,887,098 |
| | ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ සහ රත්නපුර වෙළඳසැල් | 20,385,819 | 17,868,620 |
| | පොත් අලෙවිය | (1,925) | (1,551) |
| | ලාභාංශ | 1,351,171 | 838,432 |
| | කුලී ආදායම් | 1,194,579 | 221,000 |
| | වෙන්දේසි අයිතම වලින් ලද මුදල් | 1,409,522 | 19,003 |
| | ස්ථාවර වත්කම් අලෙවියෙන් ලද ලාභ | 103,034 | 10,976,843 |
| | රක්ෂණ නියෝජිතායතන වලින් ලද ආදායම් | 342,866 | 267,009 |
| | ස්වර්ණාභරණ අලෙවිය | 183,412 | 114,975 |
| | ලෝක වෙළ.මධ්‍ය. සාමාන්‍ය සාමාජික ගාස්තු | 96,906 | - |
| | | **26,730,178** | **34,191,429** |

| 30. | පරිපාලන වියදම් | 2013 | 2012 |
|---|---|---|---|
| | දායක මුදල් | 290,748 | 814,385 |
| | සංග්‍රහ වියදම් - (දේශීය) | 486,853 | 512,225 |
| | දුරකථන ගාස්තු | 4,208,361 | 4,926,368 |
| | තැපැල් හා මුද්දර | 992,058 | 814,552 |
| | අන්තර්ජාල ගාස්තු | 247,427 | 233,906 |
| | ටෙලෙක්ස් සහ පැක්ස් ගාස්තු | 74,921 | 71,531 |
| | අධ්‍යක්ෂ මණ්ඩල වියදම් | 620,905 | 468,750 |
| | කුලී | 3,520,511 | 2,480,539 |
| | විදුලිය | 9.397,814 | 8,066,464 |
| | වරිපනම් සහ බදු | 919,390 | 927,157 |
| | පුවත් පත් සහ වාර සඟරා | 92,016 | 120,140 |
| | ජල ගාස්තු සහ බදු | 957,329 | 859,783 |
| | ප්‍රචාරක | 853,070 | 255,263 |
| | ප්‍රවාහන | 104,214 | 194,995 |
| | රක්ෂණය | 2,370,246 | 2,082,460 |
| | නීති වියදම් | 3,668,733 | 606,339 |
| | වර්ෂය සඳහා විගණන ගාස්තු | 500,000 | 354,000 |
| | පසුගිය වසරවල විගණන ගාස්තු අධි වෙන්කිරීම | - | - |
| | මිනින්දෝරු ගාස්තු | 370,002 | 59,500 |
| | කළමනාකාරිත්ව උපදේශක ගාස්තු | 412,100 | 50,170 |
| | ගොඩනැගිලි නඩත්තු | 4,246,674 | 3,784,346 |
| | උපකරණ නඩත්තු | 1,909,240 | 1,380,407 |
| | ආරක්ෂක සේවා | 2,459,209 | 2,568,134 |
| | වැඩමුළු සහ පුහුණු (දේශීය) | 912,422 | 701,727 |
| | වැටලීම් වියදම් | 328,977 | 536,628 |
| | සාමාන්‍ය වෙන්දේසි වියදම් | 3,056,022 | 9,398,295 |
| | ත්‍යාග | 1,977,800 | 2,657,000 |
| | පාරිභෝගික වත්කම් | 350,225 | 68,025 |
| | කාර්යාල මිලදී ගැනීම් | 1,530,931 | 2,148,232 |
| | භාවිත ඉඩම් අයිතිය භාවිතයේ ක්‍රමක්ෂය | 2,364 | 2,364 |
| | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 3,146,415 | 2,126,749 |
| | පරික්ෂණාගාර සැපයුම් | 800,927 | 85,000 |
| | පාරිසරික වියදම් | 7,183,612 | 1,277,517 |
| | ක්ෂවීම් | 25,259,064 | 13,093,088 |
| | අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය | 208,875 | 376,375 |
| | ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කුලී | 15,844,811 | 14,482,199 |
| | ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ විදුලිය බිල | 1,430,385 | 1,576,366 |
| | ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ නීතිඥ ගාස්තු | (137,379) | - |
| | 40 වන සංවත්සර වියදම් | - | - |
| | රථ වාහන නඩත්තු | 4,213,686 | 2,001,638 |
| | ඉන්ධන සහ තෙල් | 8,532,071 | 7,066,448 |
| | ටයර් සහ ටියුබ් | 1,254,082 | 587,342 |
| | රථ වාහන රක්ෂණ සහ බලපත්‍ර | 1,316,336 | 1,765,808 |
| | රථ වාහන නැවතුම් ගාස්තු | 1,425 | 33,000 |
| | රථ වාහන රක්ෂණ වන්දි | (455,201) | (183,060) |
| | පොදු වියදම් | 300,415 | 56,836 |
| | ව්‍යාපෘති වියදම් | 3,014,321 | 1,053,597 |
| | තැන්පත් සහ අත්තිකාරම් වල අගය හාණි වීම් සඳහා වෙන්කිරීම් | - | 76,500 |
| | නීති ගෙවීම් සඳහා වෙන්කිරීම් | 3,400,000 | 195,300 |

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

| | | 2013 | 2012 |
|---|---|---|---|
| | බැංකු ගාස්තු | 224,869 | 228,070 |
| | මැණික් ඉඩම් පුනරුත්ථාපන වියදම් | - | - |
| | ඉල්ලුම් නොකල ජාතිය ගොඩනැගීමේ බදු | 823,428 | 818,324 |
| | බොල්ණය | 1,404,560 | - |
| | දේපළ, පිරියත හා උපකරණ හාණි පාඩු සඳහා වෙන්කිරිම් | 1,952,934 | 2,934,756 |
| | ගිණුම් වලින් ලියා හැරීම් /(ඇතුලත්කිරීම්) | - | (100,988) |
| | | **126,580,200** | **96,694,548** |
| **31.** | **සේවක වියදම්** | | |
| | වේතන සහ දීමනා | 66,368,517 | 64,184,692 |
| | වැඩ බැලීමේ දීමනා/අවධානම් දීමනා | 505,234 | 657,002 |
| | සේවක අර්ථ සාධක යටතට නොගැනෙන වේතන | 8,873,808 | 8,916,922 |
| | සේවක අර්ථ සාධක අරමුදල | 11,091,742 | 10,476,487 |
| | සේවක භාරකාර අරමුදල | 2,134,731 | 2,052,685 |
| | අතිකාල | 3,530,029 | 2,800,118 |
| | නිවාඩු දින වැඩකිරීම සඳහා ගෙවීම | 179,213 | 429,628 |
| | ත්‍යාග (රන් පදක්කම්) | - | 399,065 |
| | නිවාඩු ප්‍රසාද දීමනා | 3,907,869 | 3,821,351 |
| | සේවක නිවාස ණය පොලී ගෙවීම් | 623,826 | 339.988 |
| | සේවක දිරි දීමනා | 7,195,008 | 7,031,445 |
| | පාරිතෝෂික | 8,115,151 | (115,661) |
| | ගමන් වියදම් (දේශීය) | 2,104,513 | 2,162,098 |
| | කාර්ය මණ්ඩල නිල ඇඳුම් | 222,168 | 451,321 |
| | සේවක සුභ සාධන | 5,528,905 | 4,404,190 |
| | කම්කරු වන්දි | 246,300 | 100,000 |
| | වෛද්‍ය ගාස්තු | 4,216,211 | 4,500,000 |
| | වෛද්‍ය අරමුදල | - | - |
| | ප්‍රවාහන දීමනා | 5,228,000 | 3,585,250 |
| | | **130,071,227** | **116,196,580** |
| **32.** | **ප්‍රවර්ධන වියදම්** | | |
| | ගමන් වියදම් ( විදේශීය) | - | 2,307,720 |
| | ප්‍රදර්ශන වියදම් ( දේශීය) | 14,049,238 | 25,296,665 |
| | ප්‍රදර්ශන වියදම් ( විදේශීය) | 10,173,420 | 4,001,221 |
| | ප්‍රචාරණය ( දේශීය) | 4,858,957 | 5,480,298 |
| | ප්‍රචාරණය (විදේශීය) | - | - |
| | අනිකුත් | 1,726,131 | 1,312,072 |
| | අයකරගත නොහැකි ශේෂයන් ලිය හැරීම් | - | 9,786,538 |
| | වියදම් ඌණ වෙන්කිරීම් | - | - |
| | | **30,807,746** | **48,184,513** |
| **33.** | **ශුද්ධ මූල්‍ය ආදායම්** | | |
| | **පොලී ආදායම්** | | |
| | ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත් මත පොලී | 109,662,052 | 47,138,919 |
| | සේවක ණය පොලී | 479,945 | 489,228 |
| | | **110,141,997** | **47,628,147** |
| | **පොලී වියදම්** | | |
| | කල් බදු ගෙවීම් බැරකම් මත වූ මූල්‍ය පිරිවැය | (24,500) | (24,190) |
| | | (24,500) | **(24,190)** |
| | | **110,117,497** | **47,603,957** |

**34. ආදායම් බදු වියදම්**

| | | 2013 | 2012 |
|---|---|---|---|
| වර්තමාන බදු වියදම් | (34.1) | 58,691,033 | 142,736,852 |
| පසුගිය වසර සඳහා (ඌණ)/ අධි වෙන්කිරීම් මත ගැලපීම් | | - | - |
| විලම්භිත බදු ගාස්තු/ (වෙනස් කිරීම්) | | 2,230,123 | 23,073,888 |
| | | **60,921,156** | **165,810,740** |

34.1 **වර්තන බදු වියදම් සහ ගිණුම් ලාභ ඉපයීම් අතර සැසඳීම්**

| | 2013 | 2012 |
|---|---|---|
| **බදු වලට පෙර ගිණුම් ලාභ** | **120,084,001** | **350,928,300** |
| ඉඩ නොදෙන අයිතමයන් එකතුව | 146,720,857 | 44,667,653 |
| ඉඩ දිය හැකි අයිතමයන් එකතුව | (26,491,622) | (32,435,041) |
| අනිකුත් ප්‍රභවයන්ගෙන් ආදායම් | (143,825,087 | (78,053,179) |
| වෙළඳ හෝ ව්‍යාපාරික කටයුතු වලින් ලාභ/ (පාඩු) | **96,488,149** | **285,107,733** |
| | | |
| බදු සඳහා අදාල අනිකුත් ආදායම් - පොලී ආදායම් | 141,563,392 | 65,717,767 |
| **එකතු ව්‍යවස්ථාපිත ආදායම්** | **238,051,541** | **350,825,500** |
| සුදුසුකම් ලබන ගෙවීම් | (101,525,000) | (2,657,000) |
| බදු පාඩුවීම් උපයෝජනය | - | (86,240,991) |
| **තක්සේරුගත ආදායම්/ බදු අයකල හැකි ආදායම්** | **136,526,541** | **261,927,509** |
| ව්‍යවස්ථාපිත බදු ප්‍රතිශතයවූ 28% මත බදු ගාස්තු | 38,227,431 | 73,339,703 |
| දළ ලාභාංශ මත බදු | 20,463,602 | 69,397,149 |
| වර්ෂය සඳහා සාමන්‍ය කටයුතු මත වර්තන බදු | **58,691,033** | **142,736,852** |
| **බදු පාඩු** | | |
| ඉදිරියට ගෙනා පාඩු | **-** | **86,240,991** |
| ඇතුලත්වූ පාඩු | - | - |
| උපයෝජනය කල පාඩු | - | (86,240,991) |
| **ඉදිරියට ගෙනයන පාඩු** | **-** | **-** |

**35. ප්‍රාග්ධන සහ අනිකුත් බැඳීම්**

වාර්තාකරණ කාල පරිච්ජේදය තුල ප්‍රමාණාත්මක ප්‍රාග්ධන වියදම් හෝ අනිකුත් මූල්‍ය බැඳීම් කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොමැත.

**36. වාර්තාකරණ කාල පරිච්ජේදයට පසු ඇතිවන සිදුවීම්**

වාර්තා කරනු ලබන දෙසැම්බර් 31 දින සහ ගිණුම් අත්සන් කරන කාල පරිච්ජේදය තුල ගැලපීම් සිදුකිරීමට හෝ හෙළිදරව් කිරීමට කාල පරිච්ජේදයට පසු ඇතිවන සිදුවීම් නොමැත.

**37. අසම්භාව්‍ය බැරකම්**

අධිකාරියෙහි සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු හේතුවෙන් පැන නගිනු ලබන නීත්‍යාණුකූල අසම්භාව්‍ය බැරකම් ඇත. වෙන්කිරීම් ලෙස හඳුනාගෙන දක්වා තිබේනම් (සටහන් 27), එම බැඳීම් පියවා ඉවත් කිරීමේදී සම්පත් ඉවතට ගලායාම සහ එය සාධාරණීකරනය කලහැකි නම් කළමණාකාරීත්වය එය සැලකිල්ලට ගනු ලැබේ. අධිකාරියෙහි නීති අංශයේ නීති උපදෙස් මත මෙම ගණනය කිරීම් රදා පවතිනු ඇත.

**38.** **සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම**

අධිකාරියෙහි සම්බන්ධිත පාර්ශවයන් මහා භාණ්ඩාගාරය, රජයට සම්බන්ධිත ආයතන, රජයට අයත් ව්‍යාපාරික ආයතන සහ ප්‍රධාන කළමණාකාරිත්වයේ පුද්ගලයින් ගෙන් සමන්විත වේ.

ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමයේ අරමුදල් සහ මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත කරුවන්ගෙන් එකතුකරන ලද මුදල් වලින් සීමා සහිත ලංකා ජෙමලොජිකල් ලැබොරටරි ආයතනය (Lanka Gemological Laboratory (PVT) Ltd) පිහිටුවන ලද අතර 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 116,297,121 ක් විය.

38.1 **ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් හා සිදුවූ ගණු දෙණු**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 අනුව "සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම" ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන්හට කෙලින්ම හෝ වක්‍රව ආයතනයේ කටයුතු සැලසුම් කිරීම, මගපෙන්වීම්, පාලනය කිරීම් පිළිබද වගකීම පැවරී ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් ලෙස වර්ගීකරණය කෙරේ.

| ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන්සමග සිදුවූ ගණුදෙණු පහත දක්වා ඇත. | 2013 | 2012 |
|---|---|---|
| පාරිශ්‍රමික සහ අනෙකුත් කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 2,011,950 | 2,011,950 |
| සේවා කාලයෙන් පසු ප්‍රතිලාභ | 20,056 | 20,056 |

**38.2** **සම්බන්ධිත පාර්ශවයන් හා ගණුදෙණු**

අධිකාරිය විසින් සම්බන්ධිත පාර්ශවයන් හා සිදුකරන ලද ගණුදෙණු පිළිබද වැදගත් තොරතුරු පහත දක්වා ඇත.

| **සම්බන්ධිත පාර්ශවය** | වාර්තා කරනු ලබන කාල පරිච්ජේදය සඳහා කරන ලද ගණුදෙණුවල ස්වභාවය | ගණුදෙණුවේ වටිනාකම | ශේෂය (ගෙවිය යතු) / ලැබිය යුතු |
|---|---|---|---|
| රජයට අයිති ව්‍යාපාරික ආයතන | ස්ථාවර සහතික වල සහ භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | 876,781,011 | |
| | ස්ථාවර සහතික සහ භාණ්ඩාගාර බිල්පත් ආපසු ගැනීම් | 34,545,451 | 842,235,560 |
| | ආපසු මිලදී ගතහැකි ආයෝජන (REPO) | 83,454,600 | |
| | ආපසු මිලදී ගතහැකි ආයෝජන (REPO) ආපසු ගැනීම් | 41,219,753 | 42,234,847 |
| අනිකුත් රජය හා සම්බන්ධිත ආයතන | කොටස්වල ආයෝජනය | | 1,000,000 |

මගේ අංකය / எனது இல. / My No. } ඊඑම 2/ජේ/එන්ජීජේ/1/13/1 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2014 සැප්තැම්බර් 23 දින

සභාපති,

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය.

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 21(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2014 අප්‍රේල් 24 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයිම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයිමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයිම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම් විගණනයේදි නිරීක්ෂණය විය.

| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට යොමුව (ශ්‍රී.ල.ගි.ප්‍ර) | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ශ්‍රී.ල. ගි.ප්‍ර 7 | (i) | සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද බදු මුදල රු. 135,980,365 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු. 73,880,544 ක් ලෙස දක්වා තිබුණි. |
| | (ii) | සමාලෝචිත වර්ෂය තුල වත්කම් අත්පත් කරගැනීම සඳහා රු. 12,141,003 ක වියදමක් දරා තිබූ අතර වත්කම්වලට රු. 29,072,500 ක ගැලපීමක් කර තිබුණි. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම ගැළපීමද ඇතුළත්ව ආයෝජන මුදල් ගලායාම් ලෙස රු. 41,213,503 ක් දක්වා තිබුණි. |
| | (iii) | සමාලෝචිත වර්ෂය තුල මුදලින් ලද මුළු ලාභාංශ රු. 901,934 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු. 811,171 ක් ලෙස දක්වා තිබුණි. |
| | (iv) | සමාලෝචිත වර්ෂයේදී වත්කම් අපහරණයෙන් ලැබූ මුදල රු. 130,700 ක් වුවද වත්කම්වලට කරන ලද රු. 449,500 ක ගැලපීම්ද එකතු කොට මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු. 934,608 ක් ලෙස දක්වා තිබුණි. |
| | (v) | සමාලෝචිත වර්ෂය තුල වත්කම් හානිකරණය වෙනුවෙන් රු. 1,952,934 ක් ප්‍රතිපාදනය කර තිබුණද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු. 37,001,579 ක් ලෙස දක්වා තිබුණි. |
| (ආ) ශ්‍රී.ල. ගි.ප්‍ර 16 | | 2005, 2006, 2007 හා 2008 වර්ෂවලදී මිලදී ගන්නා ලද ලියාහල අගය ශුන්‍ය වූ රු. 31,300,527 ක් වටිනා වාහන 12 හි සාධාරණ අගය පොත්වල දක්වා නොතිබූ අතර ජංගම නොවන වත්කම් තුල පිරිවැය රු. 8,275,635 ක් වූ පොත් අගය ශුන්‍ය වූ නිෂ්කාර්ය වත්කම් වන ආභරණ උපකරණ, යන්ත්‍ර හා ගෙවුඩ උපකරණ ඇතුළත් වී තිබුණි. |
| (ඇ) ශ්‍රී.ල. ගි.ප්‍ර 32 හා 39 | | කල්පිරෙන දිනය දක්වා තබා ගැනීමේ අරමුණින් ආයෝජන කරන ලද (HTM) රු. 216,381,558 හා රු. 625,854,003 වූ ස්ථාවර තැන්පතු ආයෝජනවල පොළිය සඵල පොළී අනුපාතය (EIR) අනුව ගිණුම්ගත කර නොතිබුණි. |

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී මිලදීගෙන තිබූ පිරිවැය රු. 43,140,179 ක් වූ වාහන 7ක් සඳහා එම වර්ෂයේදී ක්ෂය වෙන්කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ක්ෂය වෙන්කිරීම් ගිණුමේ ශේෂය රු. 7,958,059 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ස්වර්ණාභරණ සැපයුම්කරුවන්ට ගෙවිය යුතු රු. 540,937 ක මුදල අදාල ණයහිමි ගිණුමට බැර නොකර ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලට බැර කිරීම නිසා එම ගිණුමේ ශේෂය වැඩියෙන් දක්වා තිබුණු අතර ණය හිමි ගිණුම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) කල් බදු පදනම මත ලබාගෙන තිබූ මෝටර් රථ දෙකක් සඳහා අත්පත් කරගැනීමේදී ගෙවන ලද රු. 542,250 ක මුදල පමණක් ගිණුම්ගත කර තිබූ අතර එම වාහනවල මුළු පිරිවැය ගණනය කර පොත්වලට ගෙන නොතිබුණි.

### 2.2.4 ගෙවිය යුතු ගිණුම්

ඉඩම් වෙන්දේසි සඳහා ගෙවිය යුතු මුදල් හා සියයට 10 රඳවාගත් මුදල් වෙනුවෙන් පිළිවෙලින් 23,148,095 හා 2,568,825 වසර 5 ක කාලයක සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් පැවතුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලදී.

| අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| බෙලිදෙනිය ඉඩම | 889,000 | හිමිකම් ඔප්පුව |
| නාවුල ඉඩම | 538,800 | හිමිකම් ඔප්පුව |
| රත්නදීප ප්‍රදර්ශනාගාර නවීකරණ කොන්ත්‍රාත්තුව | 2,724,037 | කොන්ත්‍රාත් ගිවිසුම, බිල්පත් වැඩ නිමකිරීම් සහතික |

## 2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ඡේදයේ 5.2.6 ඡේදය | බඳවා ගැනීම්, උසස්වීම් සඳහා අමාත්‍යාංශයේ නිලධාරියකුගෙන් සමන්විත තේරීම් මණ්ඩලයක් පත්කල යුතු වුවත් එසේ නොමැතිව පාලක මණ්ඩලයේ පෞද්ගලික ප්‍රශංසා ලබාදෙමින් උසස්වීම් ලබා දී තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| මු. රෙ. 142(2) | රජයට ලැබිය යුතු ගාස්තුවක් හෝ අය කිරීමක් මත සේවාවක් ඉටු කිරීමේදී හෝ බලපත්‍ර,අවසර පත්‍ර නිකුත් කරන විට අය කිරීම් ලැබී උපලබ්ධි වනතුරු, එම සේවාව ඉටු නොකල යුතු වුවත් මැණික් හා ස්වර්ණාභරණ අපනයනයේදී අපනයන වටිනාකම මත අයකල යුතු රු. 1,015,158 ක් වූ සේවා ගාස්තු දින 02 සිට දින 16 දක්වා ප්‍රමාද කාලයක් සහිතව අයකර තිබුණි. |
| මු රෙ 371(බී) | යම් කාර්යයක් සඳහා ලබාදෙන අත්තිකාරම් මුදල රු. 20,000 නොඉක්මවිය යුතු වුවද එකී සීමාව ඉක්මවා අත්තිකාරම් ලබා දී තිබුණි. |

(ඇ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ

| | |
|---|---|
| 2.7.5 මාර්ගෝපදේශය | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සඳහා රේඛීය අමාත්‍යාංශ නියෝජිතයෙකු පත්කල යුතු වුවත් කොන්ත්‍රාත් වටිනාකම රු. 2,383,533 ක් වූ රත්නදීප ප්‍රදර්ශනාගාර නවීකරණ කොන්ත්‍රාත්තුව සඳහා එසේ සිදුකර නොතිබුණි. |
| 2.8.4 මාර්ගෝපදේශය | උක්ත කොන්ත්‍රාත්තුව සඳහා පත්කල තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා අමාත්‍යාංශ සාමාජිකයකු හෝ වෙනත් බාහිර ආයතනයක සාමාජිකයෙකු පත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2006 ඔක්තෝබර් 09 දිනැති අංක 39 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ සභාපති විසින් රු. 364,600 ක වටිනාකමැති ඉන්ධන ලීටර් 2,291 ක්ද අධ්‍යක්ෂ ජනරාල් විසින් රු. 400,007 ක වටිනාකමැති ඉන්ධන ලීටර් 2,476 ක් හා අධ්‍යක්ෂ (ඉඩම්,කැනීම් හා පරිසර) විසින් රු. 396,856 ක් වටිනා ඉන්ධන ලීටර් 3,282 ක්ද පූර්ව අනුමැතියකින් තොරව ලබාගෙන තිබුණි. |
| (ඉ) 1999 ඔක්තෝබර් 8 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පෞද්ගලික පාවිච්චිය සඳහා නිල වාහන හිමිකම් නොමැති අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 8 දෙනෙකුට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබානොගෙන නිල වාහන වෙන්කර දී තිබුණි. |
| (ඊ) 2011 නොවැම්බර් 03 දිනැති අංක ඩීඑම්එස්/ඊ2/33/7/2013/3 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව නව තනතුරු ඇතිකල නොහැකි නමුත් අනුමත තක්සේරුකරු/ රත්න විද්‍යාඥ එක් තනතුරක් වුවද තනතුරු 2 ක් සඳහා උසස් වීම් ලබාදී තිබුණි. |
| (උ) 2011 දෙසැම්බර් 21 දිනැති ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | විදේශ ප්‍රදර්ශන සඳහා යවා තිබූ රු. 251,265,020 ක් වටිනා මැණික් තොග අපනයනය කර මාස 06 ඉක්මවා තිබුණද එම මැණික් තොගයන් සඳහා අයකල යුතු රු. 807,467 ක සේවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පිහිටි රත්නදීප ප්‍රදර්ශනාගාර නවීකරණ කොන්ත්‍රාත්තුව සඳහා අනුමත කොන්ත්‍රාත් වටිනාකම වූ රු 2,383,533 ක් ඉක්මවා අදාල කොන්ත්‍රාත් සමාගම වෙත රු. 340,504 ක් ටෙන්ඩර් මණ්ඩල අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(ආ) මැණික් සහ ස්වර්ණාභරණ සාප්පු බලපත්‍ර වාර්ෂික අලුත්කිරීමේදී අයකරනු ලබන රු. 5,000 ක බලපත්‍ර ගාස්තුව උපයෝගී කොටගෙන ස්වර්ණාභරණ කර්මාන්තයේ තාක්ෂණික සංවර්ධනය සඳහා පිහිටුවා ඇති ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලින් රු. 2,456,515 ක මුදලක් වෙනත් කටයුතු සඳහා ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය බදුවලට පෙර ශුද්ධ ලාභය රු 120,084,002 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු 350,928,300 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු. 230,844,298 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි ආදායම 104,460,767 කින් අඩු වීම සහ වියදම රු 126,383,532 කින් වැඩි වීම බලපා තිබුණි.

ආදායම් තුළ ඇතුළත් ඉඩම් වෙන්දේසි ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු. 260,274,001 කින් අඩු වී තිබුණි.

## 3.2 ලාභදායිත්වය

| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ආදායම | 219,443,811 | 228,963,191 | 250,300,467 | 612,003,941 | 507,543,175 |
| වියදම | 230,941,998 | 261,929,677 | 222,488,066 | 261,075,641 | 387,459,173 |
| බදුවලට පෙර ලාභය (අලාභය) | (11,498,187) | (32,966,486) | 27,812,401 | 350,928,300 | 120,084,002 |

මේ අනුව ඉකුත් වර්ෂ ගණනාවක සිට අධිකාරියේ ලාභදායිතාවය විශාල උච්චාවචනයන්ට භාජනය වී තිබූ බව නිරීක්ෂණය විය.

## 3.3 විශ්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සංසන්දනය කර බැලීමේදී අධිකාරියේ මුළු ආදායම සමාලෝචිත වර්ෂය තුලදී රු. 104,460,767 කින් එනම් සියයට 17කින් අඩු වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සංසන්දනය කර බැලීමේදී අධිකාරියේ මුළු වියදම සමාලෝචිත වර්ෂය තුලදී රු. 126,383,532කින් එනම් සියයට 48 කින් වැඩි වී තිබුණි.

(ඇ) මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සමාලෝචිත වර්ෂයේදී රු.90,541,060 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී රු. 404,192,548 ක්ව තිබුණි.

(ඈ) ස්කන්ධයට මෙහෙයුම් ලාභ අනුපාතය ඉකුත් වර්ෂයේදී සියයට 33.5 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී සියයට 1. 02 ක්ව පැවතුණි.ඒ අනුව එහි සැලකිය යුතු පිරිහීමක් නිරීක්ෂණය විය.

**3.4** ආයතනයට එරෙහිව හා ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බාහිර පුද්ගලයින් හත්දෙනෙකු විසින් රු. 3,400,000 ක වන්දි ඉල්ලා අධිකාරියට එරෙහිව අධිකරණවල නඩු 7 ක් ගොනුකර තිබුණි.

(ආ) රජයේ මුදල් වංචා කිරීම සම්බන්ධයෙන් බාහිර පුද්ගලයෙකුට එරෙහිව අධිකාරිය විසින් රු. 2,964,625 ක මුදලක් හා එයට අදාල අලාභ අයකර ගැනීමට අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි.

**3.5** වියදම්වල අසාමාන්‍ය වැඩිවීම්

ඉකුත් වර්ෂය හා සාපේක්ෂව සංසන්දනය කිරීමේදී පහත සඳහන් වියදම්වල අසාමාන්‍ය වැඩිවීමක් නිරීක්ෂණය විය.

| විස්තරය | 2013 | 2012 | වැඩිවීම | වැඩිවීමේ ප්‍රතිශතය | නිරීක්ෂණ |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| වාහන නඩත්තු වියදම් | 4,213,686 | 2,001,638 | 2,212,048 | 110 | වාහන සේවාකිරීම් සඳහා වියදම් වැඩි වී තිබුණි |
| නීති වියදම් | 3,668,733 | 606,339 | 3,062,394 | 505 | අපේක්ෂිත නීති ගාස්තු සඳහා ප්‍රතිපාදන කර තිබුණි |
| වන්දි සඳහා වෙන්කිරීම් | 3,400,000 | 195,300 | 3,204,700 | 1641 | විවිධ නඩු සඳහා වෙන්කිරීම් කර තිබුණි |
| ක්ෂය වෙන්කිරීම් | 25,259,064 | 13,093,088 | 12,165,976 | 93 | නව මෝටර් වාහන මිලදී ගෙන ක්ෂය කර තිබුණි |
| ප්‍රවාහන දීමනා | 5,228,000 | 3,585,250 | 1,642,750 | 46 | දීමනා මුදල වැඩිකර තිබුණි |
| පාරිතෝෂික | 8,115,151 | (115,661) | 8,230,812 | 7166 | පාරිතෝෂික ගැලපීම සඳහා නව ගිණුම් ප්‍රතිපත්තියක් හඳුන්වා දී තිබුණි |

4. මෙහෙයුම් සමාලෝචනය

---

4.1 කාර්යසාධනය

---

4.1.1 මැණික් ඉඩම් වෙන්දේසිය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුරුවිට නාලන්ද එල්ලාවල කර්මාන්ත පුරයට වෙන්කල භූමිය මැණික් ගැරීම සඳහා නිදහස් කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) බරවර්ධන ඔය හා හසලක ඔය මැණික් ඉඩම් වෙන්දේසි කර තිබුණද ගැණුම්කරුවන් කිහිපදෙනෙකු ලංසු මුදලින් අත්තිකාරම් මුදලක් ගෙවා තිබූ අතර, සම්පූර්ණ මුදලම ලබාගෙන මැණික් ගැරීමට බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි.

4.1.2 මැණික් හා ස්වර්ණාභරණ අපනයනය කිරීම

---

(අ) කපා ඔප දමන ලද මැණික් අපනයන විශේෂ ව්‍යාපෘතිය ( NSS )

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඇ. ඩො. 1500 ක ගාස්තුවක් ගෙවා පරීක්ෂා කිරීමකින් තොරව අපනයනය කිරීම සඳහා යවන ලද මැණික් බහාළුම්වලට අදාල වවුචර පත් 33 ක් නිකුත් කර තිබූ අතර ගුවන්තොටුපල රේගුව විසින් වවුචර් අවලංගු කර ඊට අදාල ඉන්වොයිස්ද සමඟ ආපසු අධිකාරියට එවිය යුතු වුවද වවුචර් 10 ක් ගෙන්වා ගෙන නොතිබුණි. මේ හේතුවෙන් මැණික් අපනයන වටිනාකම් වල නිවැරදි සංඛ්‍යාලේඛණ විගණනයට ලබාදීමට අධිකාරියට නොහැකි වී තිබුණි.

(ii) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 14(1) ඊ වගන්තියට අනුව නීතිවිරෝධී ලෙස මැණික් ශ්‍රී ලංකාවෙන් ඉවත්කිරීම වැලැක්වීම අධිකාරියේ ප්‍රධාන කාර්යයක් වුවද නව ක්‍රමවේදය අනුව මැණික් අපනයනයේදී අධිකාරියේ තක්සේරුකරුවන් මැණික් පරීක්ෂාව හා තක්සේරුකිරීම සිදුනොකිරීම හේතුවෙන් එම අරමුණ ඉටුවී නොතිබුණි.

**(ආ) විදේශ ප්‍රදර්ශන සඳහා මැණික් අපනයනය කිරීමේදී ක්‍රියාත්මක සේවාගාස්තු සහන ක්‍රමවේදය (Service Fee Waiver Facility)**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විදේශ ප්‍රදර්ශන සඳහා රැගෙන යන අධික වටිනාකමක් සහිත මැණික් ගල් විශාල වශයෙන් අලෙවි නොවී නැවත රැගෙන එන බවත්, විදේශවලට රැගෙන ගිය මැණික් ගල්ම නැවත රැගෙන එන්නේදැයි සොයාබැලීම සඳහා ඡායාරූප ගැනීම සහ මිණුම් කිරීම වැනි පාලන විධික්‍රම අධිකාරිය විසින් අනුගමනය කර නොතිබුණි.

(ii) විදේශ රසායනාගාර පරීක්ෂණ සඳහා සේවා ගාස්තු සහන පදනම මත යවන ලද අපනයන වටිනාකම රු. 6,096,256 ක් වූ මැණික් සම්බන්ධයෙන් අපනයනයන්ට අවශ්‍ය අනුමැතිය, විදේශයේදී ලබාගත් රසායනාගාර පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) මැණික් අපනයනය සඳහා වෙළෙඳ බලපත්‍ර ලබාදීම**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මැණික් වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේදී මැණික් තොගයේ වටිනාකම පදනම් කරගෙන ගාස්තු අයකරන අතර අඩු වටිනාකමින් යුතු බලපත්‍ර හිමියන් වැඩි වටිනාකමින් යුතු මැණික් අපනයනය කිරීමේදී තම බලපත්‍ර තාවකාලිකව ඉහල වටිනාකමකට ගැලපෙන පරිදි අළුත් කර ගනී. ඒ පිළිබඳ පරීක්ෂා කිරීමට නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ii) අධිකාරියේ පුරවැසි ප්‍රඥප්තිය අනුව එක් දින සේවාව යටතේ රු. 1,000 ක අමතර ගාස්තුවක් අයකර වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීමට ක්‍රමවේදයක් තිබියදී තොග සීමාව වැඩිවීම මත ලබාගත යුතු නව වෙළඳ බලපත්‍රය වෙනුවට ගාස්තු ගෙවූ කුවිතාන්සිය පදනම් කරගෙන අපනයනය සඳහා අවසර දී තිබුණි.

### 4.1.3 ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කඩ කාමර කුලියට දීම

ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ වර්ග අඩි 8700 ක් කුලී පදනම මත ගෙන මැණික් හා මැණික් ඔබ්බන ආභරණ කර්මාන්තයේ නියැලෙන්නන් වෙත කුලී පදනම මත කඩ කාමර ලබාදී තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලබා දී තිබූ කඩ කාමර අතරින් කාමර 4 ක් සඳහා 2008, 2009 හා 2010 වර්ෂවලට අදාලව රු. 1,404,560 ක්වූ හිඟ කුලී අයකර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ආ) ආයතනයේ නීතිඥවරු දෙදෙනෙකු ඇතුළු නිලධාරීන් 4 දෙනෙකුගෙන් සමන්විත නීති අංශයක් ආයතනයේ ස්ථාපිතව තිබුණද 2012/2013 වර්ෂවලට අදාල කුලී ගිවිසුම් අත්සන් කිරීමෙන් නීතිඥ ගාස්තු ලෙස අයකර තිබූ රු. 177,944 ක මුදලින් සියයට 50 ක ප්‍රමාණයක් වූ රු. 88,972 ක මුදල ආයතනයේ නීති නිලධාරි වෙත නොතාරිස් ගාස්තු ලෙස ගෙවා තිබුණි. ඒ සඳහා භාවිතා කර තිබූ නම හා ආයතනයේ වැටුප් හා වේතන ලබා ගැනීමේදී භාවිතා කර තිබූ නමෙහි වෙනසක් දක්නට තිබුණි.

(ඇ) කුලී ගිවිසුම් අත්සන් කර නොතිබූ කඩ කාමර තුනක් සඳහා වූ නීතිඥ ගාස්තු ලෙස රු. 54,329 ක් අයකර තිබූ අතර කඩ කාමර 2 කට අදාල සත්‍ය කුලී වටිනාකම රු. 305,048 ක් අඩුවෙන් ගිවිසුමේ ' සඳහන් කිරීම නිසා මුද්දර ගාස්තුව රු. 3,050 ක් අඩුවෙන් අයකර තිබුණි.

(ඈ) 2013/2014 වර්ෂ සඳහා කඩ කාමර 11 කට කුලී ගිවිසුම් අත්සන් කර නොතිබූ අතර ඉතිරි කඩකාමර 26 ක කුලී ගිවිසුම් අත්සන් කිරීම ආයතනයේ නිල මුද්‍රාව යොදා නීති නිලධාරිනියගේ පෞද්ගලික කාර්යාලයේදී කර තිබුණි.

(ඉ) අධිකාරියේ සේවයේ නියුතු නීති නිලධාරිනියට අවිස්සාවේල්ල මහාධිකරණ බල ප්‍රදේශයේ තුල පිහිටි ඉඩම් සඳහා පමණක් ඔප්පු ලිවීමේ කටයුතු සිදු කිරීමට හිමිකම තිබුණද, කොළඹ මහාධිකරණ බල ප්‍රදේශය තුල පිහිටි ඉඩම්,දේපල සම්බන්ධ කුලී ගිවිසුම්වලටද එම නිලධාරිනිය අත්සන් කර තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරිසර අමාත්‍යාංශය පාවිච්චි කරනු ලබන කැබ් රථයක් අනතුරකට ලක්වී තිබූ අතර සිදුවූ අලාභය තක්සේරු කර වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

(ආ) රසායනාගාරයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2009 වර්ෂයේදී රු. 92,948,578 ක මුදලක් ලබාදී තිබුණි. 2014 මාර්තු වන විටද එම රසායනාගාරය පිහිටුවා නොතිබූ අතර මෙකී මුදල් එම ආයතනය විසින් 2009 සිට ආයෝජනය කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. 39,079,371 ක පොළියක් උපයාගෙන තිබූ අතර එකී පොළී ආදායම අධිකාරියට අහිමි වී තිබුණි.

(ඇ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ වර්ග අඩි 575 ක බිම් ප්‍රමාණයක පිහිටා ඇති රත්නදීප ප්‍රදර්ශනාගාරය වෙනුවෙන් රු. 2,995,700 ක වියදමක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට දරා තිබුණි. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන් දිරි ගැන්වීමේ පරමාර්ථයෙන් මෙය අරඹා තිබුණද එම අරමුණු ඉටුවී නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගාල්ල ප්‍රදේශයේ රසායනාගාරයක් ආරම්භ කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද රු. 4,352,949 ක්වූ උපකරණ නිෂ්කාර්යව පැවති අතර රසායනාගාරය ආරම්භ කිරීමට 2014 මාර්තු වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2002, 2003 හා 2004 වර්ෂවලදී මිලදීගෙන තිබූ රු 443,000 ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍ර 05ක් 2011 හා 2012 වර්ෂවලදී ගබඩාවට භාර දී තිබූ අතර 2014 මාර්තු අවසන් වන විටත් නිෂ්ක්‍රියව පැවතුණි.

## 4.4 කාර්යය මණ්ඩල කළමනාකරණය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 220 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය 181 ක් වීමෙන් පුරප්පාඩු 39 ක් පැවතුණි. පුරප්පාඩු තනතුරු 14 ක් මාණ්ඩලික කාර්යය මණ්ඩලය වන අතර 24 ක් මණ්ඩලික නොවන කාර්යය මණ්ඩලය විය.කෙසේ වුවද කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 55 ක් බඳවාගෙන තිබුණි.

(ආ) බඳවාගැනීමේ පරිපාටිය අනුව පූර්ණ සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් 4 දෙනෙකුගේ සේවය ස්ථිර කර තිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

---

අපනයන වටිනාකම රු. 39,694,672 ක් වූ මැණික් ගල් 62 ක් රසායනාගාර පරීක්ෂණ සඳහා රු. 1,000 ක ගාස්තුවක් ගෙවා අපනයනය කර තිබුණි. පසුව එම මැණික් ගල් වලින් ගල් 22ක් විදේශ ප්‍රදර්ශනයකදී විකුණා තිබුණි. හැසිරවීම් ගාස්තු ලෙස රු 10,000 ක් ගෙවීමෙන් සේවා ගාස්තු සහන පදනම (Service fee waiver facility) මත අපනයනය කර නොතිබියදී විකුණුම් අයිතම්වලට පමණක් සේවා ගාස්තුව ලෙස රු.45,885 ක් අය කර තිබුණි. මේ අනුව අයකල යුතු රු 198,473 ක සේවා ගාස්තුව අය නොවීමෙන් අධිකාරියට රු 152,588 ක පාඩුවක් වී තිබුණි.

## 4.6 දෘෂ්‍ය අක්‍රමිකතා

---

මානව සම්පත් කළමනාකරු තනතුරට බඳවාගැනීමේදී වැටුප් පියවරයන් 8 ක් ඉදිරියෙන් තබා වැටුප් නියම කර තිබූ අතර, ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල වැටුප් වශයෙන් රු 79,200 ක්ද නිවාඩු දින දීමනා හා දිරි දීමනා ලෙස රු. 36,844 ක්ද වැඩිපුර ගෙවා තිබුණි.

## 4.7 වාහන උපයෝජනය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය සතුව ඉකුත් වර්ෂයේදී පැවති වාහන 23 කින් යුතු වාහන ඇනියක් සමාලෝචිත වර්ෂය අවසානයටද පැවතුණි. මෙම වාහන උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| ඉන්ධන පරිභෝජනය | 8,532,071 | 7,066,448 |
| ටයර් හා ටියුබ් සවිකිරීම් | 1,254,082 | 587,342 |
| නඩත්තු වියදම් | 4,213,686 | 2,001,636 |
| බලපත්‍ර හා රක්ෂණ වියදම් | 1,316,336 | 1,765,808 |
| එකතුව | 15,316,175 | 11,421,234 |

ඒ අනුව 2012 වර්ෂයට සාපේක්ෂව වාහන සඳහා වියදම රු. 3,894,941 කින් එනම් සියයට 34 කින් වැඩි වී තිබුණි.

(ආ) සභාපතිවරයා විසින් පාවිච්චි කරන කාර් රථය 2013 පෙබරවාරි සිට 2014 පෙබරවාරි දක්වා වසරක කාලය තුල ධාවනය කර තිබූ කිලෝමීටර් 23,415 ක පමණ දුර ප්‍රමාණය සඳහා ටයර් 10 ක් මිලදීගෙන තිබූ අතර ඒ සඳහා රු. 328,530 ක වියදමක් දරා තිබුණි.

## 4.8 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------

අධිකාරියේ හිටපු සභාපති හා හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2012 වර්ෂයේදී පිළිවෙලින් රු. 728,501 ක් හා රු. 276,488 ක අමතර ඉන්ධන අනුමැතියකින් තොරව භාවිතා කර තිබූ අතර එම මුදල් එම නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.9 සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදල් ගොඩනැගීම

පාරිතෝෂික ගෙවීම් පනතේ විධිවිධාන ප්‍රකාරව පාරිතෝෂික සඳහා රු.23,995,857 ක ප්‍රතිපාදනයක් සලසා තිබූ නමුත් උද්ගත විය හැකි වගකීම් බේරුම් කිරීම සඳහා අරමුදල් සැපයීමේ වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

1993 අංක 50 දරණ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනතේ 14 වන වගන්තිය අනුව පහත සඳහන් කාර්යයන් ඉටුකිරීමට සංයුක්ත සැලැස්මට ඇතුළත්කර තිබූ නමුත් එම කාර්යයන් ඉටු කිරීමට කටයුතුකර නොතිබුණි.

| වගන්තිය | විස්තරය |
|---|---|
| 14 - ඩී | කර්මාන්තයෙහි දියුණුව උදෙසා විශේෂයෙන්ම තාප පිරියම් කරනය හා මැණික් කැපීම පිළිබඳව පුද්ගලයන් පුහුණු කිරීමට භාරගැනීම හා දියුණු කිරීම. |
| 14 - ඉ | අනාගතයේ බලාපොරොත්තු විය හැකි මිලදී ගන්නන් අතර මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය කෙරෙහි විශ්වාසය ඇති කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම. |
| 14 - එෆ් | මැණික් නීතිවිරෝධී ලෙස ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම හා නීති විරෝධී මැණික් ගැරීම් නැවැත්වීම. |
| 14 එම් | ශ්‍රී ලංකාව තුල මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය දියුණු කිරීමට හා රජයේ දෙපාර්තමේන්තු අතර අවශ්‍ය සබඳකම් ඇති කිරීම. |

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ආයතනයේ භෞතික කාර්යසාධනය මූල්‍ය තොරතුරු සමඟ සසඳා පහත දැක්වේ.

| ඉලක්කගත කාර්යය | | තත්‍ය කාර්යසාධනය |
|---|---|---|
| (අ) | මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයෙහි ජාතික ප්‍රතිපත්තියක් සැකසීම. | 2009 - 2013 සංයුක්ත සැලැස්මට අනුව 2010/2011 වර්ෂවලදී ක්‍රියාත්මක කර අවසන් කල යුතු කාර්යයක් ලෙස මෙය හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය තුලදීද මෙය ක්‍රියාත්මක කිරීමට ආයතනය අපොහොසත් වී තිබුණි. |
| (ආ) | මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ සංගනනයක් ඇති කිරීම. | සංයුක්ත සැලැස්මට අනුව 2009/2010 වර්ෂවල නිමකල යුතු වුවත් සමාලෝචිත වර්ෂය දක්වා එය ඉටු කර නොතිබුණි. |
| (ඇ) | සියළුම ස්වර්ණාභරණ නිෂ්පාදනවල වටිනා ලෝහ විශ්ලේෂණය කිරීම හා මුද්‍රා තැබීම පිළිබඳ නීතිමය වලංගුභාවයක් ලබාගැනීම. | මෙය මුළු දිවයිනෙහිම ව්‍යාප්ත කලයුතු අතර සමාලෝචිත වර්ෂයේ ගාල්ල නගරයේ රසායනාගාරයක් ආරම්භ කිරීමට රු.මිලියන 85 වෙන්කර තිබුනද, මෙම කාර්ය සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. |
| (ඈ) | ගෙවුඩ අපනයනය '0' දක්වා අඩු කිරීම | සමාලෝචිත වර්ෂයේ තාප පිරියම් කරනය සඳහා පහසුකම්, පුහුණුව හා පිරිවැය ඵලදායී ක්‍රම හඳුන්වා දීම සඳහා රු.මිලියන 5ක ප්‍රතිපාදනයන් ලබාදී තිබුණද. එහි ප්‍රගතියක් ලබා නොතිබුණි. |
| (ඉ) | නීති විරෝධී මැණික් ගැරීම් නැවැත්වීම සඳහා විශේෂ කාර්ය බලකායක් පිහිටුවීම | සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ඉටුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | මැණික් හා ස්වර්ණාභරණ අපනයන වටිනාකම වැඩිකර ගැනීම. | සමාලෝචිත වර්ෂයේදී විදේශ ප්‍රදර්ශණ 08ක් සැලසුම් කර රු. මිලියන 17.8ක් වෙන්කර තිබූ අතර එහි ප්‍රගතිය සියයට 50 මට්ටමක පැවතුණි. |
| (උ) | හොද තරගකාරිත්වයක් හා සම්පත් ලබාගැනීම සඳහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ඉල්ලුමට සරිලන මානව සම්පත් ඇති කිරීම. | මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සම්බන්ධව ඍජුවම සම්බන්ධ වන පහත සඳහන් තනතුරු පිරවීමට කටයුතු කර නොතිබුණි.<br>සහකාර අධ්‍යක්ෂ (තක්සේරු/රත්න විද්‍යාඥ)<br>සංවර්ධන සහකාර<br>පරිසර සහකාර<br>අපනයන සේවා නිලධාරී<br>තක්සේරු/ රත්න විද්‍යාඥ සහකාර<br>රසායනාගාර කාර්මික ශිල්පී<br>තාක්ෂණික සහකාර |
| (ඌ) | විස්තරාත්මක සුහසාධන ක්‍රමයක් ඇති කිරීම මඟින් සමාජ වගකීම ඇති කිරීම. | මැණික් ගරන්නන් (Gem mining community)වෙත සුහසාධන ක්‍රමයක් ඇති කිරීම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඉටුකර නොතිබුණි. |
| (එ) | මැණික් පරික්ෂා කිරීමේ හා සහතික කිරීමේ උසස් රසායනාගාරයක් ඇති කිරීම | සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ඉටුකර නොතිබුණි. |

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව අදාල අංශයන්හි අවශ්‍යතාවයන් වෙන් වෙන්ව හඳුනාගෙන ඒ අනුව එක් එක් කාලච්ඡේදය තුල සපයා ගත යුතු සිවිල් වැඩ, භාණ්ඩ හා අනිකුත් සේවා ලෙස විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

### 5.4 අයවැය ලේඛණමය පාලනය

අයවැය ගත තොරතුරු හා තත්‍ය තොරතුරු අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ අතර අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදවාගෙන නොතිබුණි.

### 5.5 වාර්ෂික වාර්තා සභාගතකිරීම්

2012 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව 2014 මැයි මාසය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලැබූ විස්තරාත්මක වාර්තාව මඟින් අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකල යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) වාහන නඩත්තුව
(ඇ) මැණික් ගැරීම් බලපත්‍ර නියමයන් අධීක්ෂණය කිරීම
(ඇ) මැණික් ඉඩම් වෙන්දේසි පැවැත්වීම
(ඉ) මානව සම්පත් කළමනාකරණය
(ඊ) අත්තිකාරම් ලබාදීම

එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති